

සන්න සහිත

# ව්‍යාසකාරයං



සන්න සහිත

# ව්‍යාසකාරය

සහ

භාෂාර්ථ සන්නයකින් යුක්ත

හිතෝපදේශයේ

පළමුවෙනි පරිච්ඡේදයෙන් කොටසක් ඇතුළත්යි.

K.D. PERERA. BOOK SELLER AND STATIONER.

කොළඹ දාම් වීදියේ නො 31 දරන කේ. ඩී. පෙරේරාගේ පොත් ශාලාවෙන් සියළුම පොත් පහසු මිලට ලබාගත හැකිවේ.

31 DAM ST. COLOMBO

ජේ. සී. පෙරේරා විසින්

කොළඹ

විද්‍යාදර්ශ යන්ත්‍රාලයෙහි මුද්‍රිතයි.

1908

# නමශ්ශාක්‍ය සිංහාය.

**ශාක්‍යසිංහාය, සර්‍වඥරජයාහට; නමඃ, නමස්කාරය;**
**(අස්තු, වේවා.)**

1 අඥාන තිමිරාන්ධානාං විභ්‍රාන්තානාං කුදෘෂ්ටිභිඃ
ඥානාඤ්ජන ශලාකාභිර්ව්‍යාසෙනොන්මීලිතං ජගත්.

1 අඥාන, නුනුවණනැමැති; තිමිර, අන්ධකාරයෙන්; අන්ධානාම්, කිසිවක් නොදක්කහෙන්නාවූ; කුදෘෂ්ටිභිඃ, මිථ්‍යාදෘෂ්ටියෙන් හෙවත් ඇතිසැටිය තබා වරදවා ගැන්මෙන්; විභ්‍රාන්තානාම්, එවේද්දෝහෝ නොවේද්දෝහෝයි සැකඇතිව මුළාව ඇවිදිනා සත්‍වයන්ට; ව්‍යාසෙන, ව්‍යාසනම් ඍෂීන් විසින්; ජගත්, ලොව හෙවත් ලෝකයෙහි කළමනා නොකළමනා කටයුතු; ඥානාඤ්ජන ශලාකාභිඃ, නුවණ නැමැති බෙහෙත් අඳුන්ලා මැදීමෙන්; උන්මීලිතං, ප්‍රකාශකොට දක්වනලදී.

2 එතාවජ්ජන්මසාඵල්‍යං යදනායත්තවෘත්තිතා
යෙ පරාධීන ජන්මානස් තෙ චෙජ්ජීවන්ති කෙ මෘතාඃ.

2 අනායත්තවෘත්තිතා, අනුන් අයිති පැවතුම් නැතිබවය යත; යත්, යමෙක්ඇද්ද; එතාවත්, මෙපමණෙක්ම; ජන්මසාඵල්‍යං, උපන් ජන්මයෙහි ප්‍රයෝජනනම් වන්නේය; යෙ, යම්සත්‍වකෙනෙක්; පරාධීනජන්මානඃ, අනුන් අයිතිවූ පැවතුම් ඇත්තාහුද; තෙ, ඒ සත්‍වයෝ; ජීවන්තිචෙත්, ඉඳින් ජීවත්වන්නාහුනම්; මෘතාඃ, මළහු; කෙ, කවුරුහුවෙද්ද.

3 සාධොඃ පරුෂ වාක්‍යෛශ්ච නමනොයාති වික්‍රියාම්
නහි තාපයිතුං ශක්‍යං සාගරාම්භස්තෘණොල්කයා.

3 පරුෂවාක්‍යෛශ්ච, ක්‍රෑරවූ බසින් (කෙවූනාවූද); සාධොඃ, සත්පුරුෂයාගේ; මනඃ, සිත; වික්‍රියාන්, විකාරයකට හෙවත් වෙනසකට; න යාති, නොපැමිණෙන්නේය; කෙසේදයත්? සාගරාම්භඃ, සමුද්‍රජලය; තෘණොල්කයා, තණසුලකින්; තාපයිතුං, තවන්නට හෙවත් හුණුකරන්නට; නශක්‍යං, නොපිළිවනි; ඒ එසේමැයි; බොහෝවූ ලවණජලය තණසුලකින් හුණුකොට ගතනොහැක්කාසේ, මුඛයෙන් ක්‍රෑරවූ බස්බිනුම් අසන්නාවූ සත්පුරුෂයාගේ චිත්තස්ව භාවය විකාරයට පමුණුවාගත නොහැක්කේයයි යනු අභිප්‍රායයි.

4 දරිද්‍රස්‍ය පරාමූර්තිර් යාච්ඤා නද්‍රවිණාල්පතා
ජරද්ගව ධනුශ්ශම්භුස් තථාපි පරමෙශ්වරඃ.

4 යාච්ඤා, අනුන්ගෙන් යම්දෙයක් ඉල්ලීම; දරිද්‍රස්‍ය, දිළිඳුබැව්
හුගේ; පරාමූර්තිර්, උතුම්වූ ශරීරවෙයි; නද්‍රවිණාල්පතා, වස්තු හීන
බැව් නොවෙයි; ඒ එසේමැයි–ශම්භුඃ, ඊශ්වරතෙම; ජරද්ගවධනඃ,
මහළුවූ නන්දිනම් වෘෂභයාම වස්තුකොට ඇත්තේය; තථාපි, එත
කුදුවුවත්; පරමෙශ්වරඃ, අතිශයින්ම ඊශ්වරයි.

5 දෙයානි තෘණපර්ණානි ශුද්ධෙන මනසාර්ථිනෙ
තදභ්‍යාසොචිතාන් ත්‍යාගාත් ස්වමාංසත්‍යාගකාරණම්.

5 තෘණපර්ණානි, තෘණපත්‍රනමුත්; අර්ථිනෙ, යාචකයාහට; ශුද්ධෙ
න මනසා, පිරිසිඳුවූ සිතින්; දෙයානි, නුවනැත්තන් විසින් දිය
යුත්තාහ; කුමක්හෙයින්දයත්? තදභ්‍යාසොචිතාත්, ඒ තෘණපත්‍රකුදු
දන්දීමෙන් පුරුදුකරණලද; ත්‍යාගාත්, පරිත්‍යාගය හෙතුකොටගෙ
ණ පසුව මනුජාතියෙහි; ස්වමාංසත්‍යාගකාරණම්, සමීපයට එළඹි
යාචකයන්ට තමාගේ ශරීරමාංස දන්දීමටද හෙතුවන්නේයි.

6 අර්ථවාන් න කුලීනොපි ලොකෙන පූජ්‍යතෙ නරඃ
ශශිනස්තුල්‍යවංශොපි නිර්ධනඃ පරිභූයතෙ.

6 අර්ථවාන්, වස්තුඇත්තාවූ; නකුලීනොපි, කුලනැත්තාවූද: න
රඃ, සත්වතෙම; ලොකෙන, ලොවැස්සා විසින්; පූජ්‍යතෙ, පුදනුලැ
බේ; ශශිනස්තුල්‍යවංශොපි, චන්ද්‍රයා හා සමාන වංශ ඇතේතේවින
මුත්; නිර්ධනඃ, වස්තුනැත්තේවිනම්; පරිභූයතෙ, ලෝවැස්සන් වි
සින් හෙලාදක්නාලැබේ.

7 අර්ථා ගෘහෙ නිවෘත්තන්තෙ ශ්මශානෙ මිත්‍රබාන්ධවාඃ
සුකෘතං දුෂ්කෘතඤ්චෛව ගච්ඡන්ත මනුගච්ඡති.

7 අර්ථාඃ, සත්වයා විසින් බාල අවස්ථාවෙහි පටන් දුක්ගෙණ ඉප
දවූ මුක්තාමාණික්‍යාදී වස්තුහු; ගෘහෙ නිවෘත්තන්තෙ, මියපරලොව
යනකල ගෙහිම නවත්නාහ පස්සෙහි අඩියකුත් නොයන්නාහ;
මිත්‍රබාන්ධවාඃ, යහලුවෝද නෑයෝද; ශ්මශානෙ (නිවෘත්තන්තෙ),
සොහොනෙහිදීම නවත්නාහ එතනින් ඔබ්බෙහි අඩියකුත් නො
යන්නාහ; ගච්ඡන්තමනු, මියපරලොව යන්නාහු සමග; සුකෘතම්,
කරණලද කුශලකර්මය හෝ; දුෂ්කෘතඤ්චෛව, කරණලද අකුශල
කර්මය හෝ; ගච්ඡති, පසුපස්සෙහි කැපිව නොහැර යන්නේයි.

8 විපත්තිඃ කාලසඤ්ජාතා දූර්වාරා යෙන කෙනචිත්
සායං පද්මවනෙ ජාතා හානිඃ කෙන නිවාර්‍ය්‍යතෙ.

8 කාලසඤ්ජාතා, උවමනාකාලයට විත්දයුතුව හටගන්නාවූ;
විපත්තිඃ, විපත්තිතොම; යෙන කෙනචිත්, යම්කිසි කාවිසිනුත්;

දුර්වාරා, චලකාලියනොහැක්කීය; ඒ එසේමැයි—ඝායම්, සවස්වේඵල හි; පද්මවනේ, පියුම්වෙනෙහි; ජාතා, හටගත්තාවූ; හානිඃ, විනා සය; කෙනනිවාර්‍ය්‍යතෙ, කවුරුන් විසින් වළකනුලැබේද නොවල කින්නේය යනුභාවයි.

9 කණ්ටකානාං ඛලානාඤ්ච ද්විවිධෛව ප්‍රතික්‍රියා
උපානහා මුඛ භඞ්ගොවා දූරතොවා විවර්ජනම්·

9 කණ්ටකානාං, පය ඇනෙන්නාවූ කටුවලටද; ඛලානඤ්ච, දුර්ජන යන්ටද; ප්‍රතික්‍රියාම්, ප්‍රතිකාරය හෙවත් සංසිඳුවන සැටිය; ද්විවිධෛ ව, දෙපරිද්දකින්ම වන්නීය; ඒ කවරසැටියේදයත්? උපානහා, වහනින්; මුඛභඞ්ගොවා, කටුවෙහි මුණත බිඳපීම හෝ; දූරතොවා විවර්ජනම්, දුර්ජනයා දුරින්ම හැරපීමහෝයි.

10 මානුෂ්‍යං මධුරං නිත්‍යං යදිනස්‍යාත් පරාශ්‍රයඃ
සුහෘද්භිඃ ස්වාදු සලිලෛඃ සුභාෂිත රසෛරපි.

10 නිත්‍යම්, නිරන්තරයෙන්; පරාශ්‍රයඃ, අනුන් ඇසුරුකිරීමක්; යදිනස්‍යාත්, ඉදින් නොවීනම්; සුහෘද්භිඃ, යහලුවන් හා සමාගම යටද; ස්වාදු සලිලෛඃ, මධුරවූ ජලයටද; සුභාෂිත රසෛරපි, ප්‍රිය තෙපුලටද වඩා; මානුෂ්‍යම්, මිනිසත්බව; මධුරං, ඉතා මිහිරියි.

11 ප්‍රලයෙ භින්න මර්‍ය්‍යාදා භවන්ති කිල සාගරාඃ
මර්‍ය්‍යාදා භෙද මිච්ඡන්ති ප්‍රලයෙපි න සාධවඃ.

11 සාගරාඃ, සමුද්‍රයෝ; ප්‍රලයෙ, කල්පාන්තයෙහි; භින්නමර්‍ය්‍යාදාඃ භවන්තිකිල, වෙරළබිඳීම් ඇත්තාහුය හෙවත් වෙරළ ඉක්මෙන්නා හුමය; සාධවඃ, සත්පුරුෂයෝ; ප්‍රලයෙපි, විනාශයට සම්ප්‍රාප්තකල් හිදු; මර්‍ය්‍යාදාභෙදම්, ආචාරබිඳපීමක්; න ඉච්ඡන්ති, නොකමැති වෙත්.

12 ශ්‍රූයතාං ධර්මසර්වස්වං ශ්‍රුත්වා චෛවාවධාර්‍ය්‍යතාම්
ආත්මනඃ ප්‍රතිකූලානි පරෙෂාං න සමාචරෙත්.

12 ධර්මසර්වස්වම්, සියළු ධර්මය තත්වූ පරිද්දෙන්; ශ්‍රූයතාං, අස නුලැබේවා; ශ්‍රුත්වාචෛව, අසාද; අවධාර්‍ය්‍යතාම්, ඉන්වන වැඩ අ වැඩ දෙක සිත තබා පරීක්ෂාකරණුලැබේවා; ඒ කෙසේදයත්? ආත්මනඃ ප්‍රතිකූලානි, තමාහට අප්‍රිය දෙයක්; පරෙෂාම්, අනුන්ට; න සමාචරෙත්, නොකරන්නේයි

13 ජලබින්දු නිපාතෙන ක්‍රමසඃ පූර්‍ය්‍යතෙ ඝටඃ
සහෙතුස්සර්වවිද්‍යානාං ධර්මස්‍ය ච ධනස්‍ය ච.

13 ඝටඃ, කළයතෙම; ජලබින්දු නිපාතෙන, දියබිඳු හිමෙන්; ක්‍රම සඃ, පිළිවෙළින්; පූර්‍ය්‍යතෙ, පුරණුලැබේද; සර්වවිද්‍යානාං, සියලු ශා ස්ත්‍රයන්ටද; ධර්මස්‍යච, ධර්මයටද; ධනස්‍යච, ධනයටද; සහෙතුඃ, එම කාරණවත්තේය හෙවත් එම උපමාවන්නේයි.

14 දුර්භික්ෂෙ චාන්නදාතාරං සුභික්ෂෙ ච හිරණ්‍යදම්
භයෙචාභයදාතාරං ස්වර්ගෙපි බහුමාන්‍යතෙ.

14 දුර්භික්ෂෙ, බත්නැතිකාලයෙහි; අන්නදාතාරංච, බත්දෙන තැනැත්තාහටද; සුභික්ෂෙ, බත්ඇති සමයෙහි; හිරණ්‍යදංච, රත්රන් දෙන තැනැත්තාහටද; භයෙච, භයක් පැමිණිකල්හි; අභයදාතාරං, භය නොවයි කියා අභය දෙන තැනැත්තාහටද; ස්වර්ගෙපි, දෙව්ලොව පවා; බහුමාන්‍යතෙ, බොහෝසේම සතුටුකරණුලැබේ.

15 සත්‍යං මනොරමාඃ කාමාඃ සත්‍යං රම්‍යා විභූතයඃ
කින්තු මත්තාඞ්ගනාපාඞ්ග භඞ්ගලොලංහි ජීවිතං.

15 කාමාඃ, රූප ශබ්ද ගන්ධ රස ස්පර්ශ යන පඤ්චකාමයෝ; සත්‍යම්, ඒකාන්තයෙන්; මනොරමාඃ, සිත්කළුහ; විභූතයඃ, සකල සම්පත්තීහු; සත්‍යම්, ඒකාන්තයෙන්; රම්‍යාඃ, ප්‍රියහ; කින්තු, බලඑකෙක් ඇති; ජීවිතම්, ඒ පඤ්චකාම සම්පත් අනුභවකරණ සත්වයාගේ ප්‍රාණය; මත්තාඞ්ගනා, තරුණස්ත්‍රීන්ගේ; අපාඞ්ගභඞ්ග, කටාක්ෂබැල්ම චඤ්චලවන්නාසේ; ලොලංහි, චපලමය බොහෝ කලක් නොපවත්නේය අස්ථිරමැයි.

16 පුංසාමුන්නත චිත්තානාං ද්වයමෙව සුඛාවහම්
සර්වසඞ්ගනිවෘත්තිර්වා විභූතිර්වාති විස්තරා.

16 උන්නතචිත්තානාම්, උඩඟු සිත්ඇති; පුංසාම්, පුරුෂයන්ට; ද්වයමෙව, දෙකක්ම; සුඛාවහම්, සුවඑලවන්නේය; ඒ කවරදෙකක්ද යත්? සර්වසඞ්ගනිවෘත්තිර්වා, සියලු සැපතෙහි කරණලද ලොභයෙන් වැලකී තපස්කිරීමහෝයි; අතිවිස්තරා, ඉතා මහත්වූ; විභූතිර්වා, සම්පත් අනුභවකිරීමහෝයි.

17 අත්‍යල්පමපි සාධූනාං ශිලාලෙඛෙව තිෂ්ඨති
ජලලෙඛෙව නීචානාං යත්කෘතං තද් විනශ්‍යති.

17 සාධූනාම්, සත්පුරුෂයන්ට කළාවූ; අත්‍යල්පමපි, ඉතා ස්වල්ප වූවත් උපකාරය; ශිලාලෙඛෙව, ගලෙහි කෙටූ අකුරක්මෙන්; තිෂ්ඨති, නොනසී පවත්නේය; නීචානාම්, අධමයන්ට; යත්කෘතං, යම් උපකාරයක් කරණලද්දේවීනම්; තත්, ඒ උපකාරය; ජලලෙඛෙව, දියෙහි ඇඳි ඉරක්මෙන්; විනශ්‍යති, නස්නේය හෙවත් අස්ථිර වන්නේයි.

18 භ්‍රමන්තො දෙහි දෙහීති භික්ෂාම්ප්‍රති විනිර්ගතාඃ
අප්‍රමාදස්‍ය පෞරාත්ම්‍යං කථයන්තී ස්වමූර්තිභිඃ.

18 දෙහිදෙහීති, අපටදෙව අපටදෙවයි; භික්ෂාම්ප්‍රති, ආහාරය පිණිස; විනිර්ගතාඃ, තමන් වසනතැනින් නික්මුනාවූ; භ්‍රමන්තාඃ,

ඇතමැත සිඟාඇවිදිනා සත්වයෝ; ස්වමූර්තිභිඃ, ස්වකීය ශරීරයෙන්; අප්‍රමාදස්‍ය, ගියජාතියෙහි දන්නුදුන්නාහුගේ; පෞරාත්ම්‍යං, පුරාතන ආත්මභාවය; කථයන්ති ප්‍රකාශකොට කියන්නන් වැන්නාහුයි.

19 දුර්ජනො නිකෘතිප්‍රායඃ සෙව්‍යමානො බුධෛරපි
ගෘහ්‍යමාණ ඉවාඞ්ගාරො නිර්මලත්වං න ගච්ඡති.

19 බුධෛඃ, නුවනැත්තන් විසින්; සෙව්‍යමානොපි, සෙවුනාලබන්නාවූද; දුර්ජනඃ, අසත්පුරුෂතෙම; නිකෘතිප්‍රායඃ, සොරකම් බහුලකොට ඇත්තේය; ඒ එසේමැයි: ගෘහ්‍යමාණඃ ආදරයෙන් අතින් අල්වාගන්නාලද; අඞ්ගාරඃඉව, අඟුරුසෙයින්; නිර්මලත්වං, නිෂ්කලඞ්ක බවට; න ගච්ඡති, නොපැමිනෙන්නේයි.

20 නාස්තිවිද්‍යා සමං මිත්‍රං නච ව්‍යාධි සමොරිපුඃ
නචාපත්‍ය සමඃ සෙනහො නච දෛවාත් පරං බලම්.

20 විද්‍යාසමං, උගත් ශාස්ත්‍රය සමවූ; මිත්‍රං, කැමති කැමති වස්තු සිඞකොට දෙන යහලුකෙනෙක්; නාස්ති, නැත; ව්‍යාධිසමඃ, කාශශ්වාසාදි රොගයට සමාන; රිපුඃ, සතුරෙකුත්; නච, නැත; අපත්‍ය සමඃ සෙනහඃ, දරුවන් කෙරෙහි ඇති ප්‍රේමයහා සමවූ ප්‍රේමයකුත්; නච, නැති; දෛවාත්, තමාගේ භාග්‍යයට වඩා; පරං බලම්, අන්‍යවූ බලයකුත්; නච, නැත්තේයි.

21 දුර්ජනෛඃ සහ සම්පර්කඃ ශත්‍රුතාපි න යුජ්‍යතෙ
ගෘහ්ණතො දහතෙඞ්ගාරඃ ශාන්තො කෘෂ්ණායන්ත කරඃ.

21 දුර්ජනෛඃ සහ, අසත්පුරුෂයන් හා; සම්පර්කඃ, එකතැන වාසයද; ශත්‍රුතාපි, ඔවුන් හා සතුරුබවද; නයුජ්‍යතෙ, නොයෙදෙන්නේය; ඒ එසේමැයි–අඞ්ගාරඃ, දිලිසෙන අඟුරු; ගෘහ්ණතඃ, ගන්නහුගේ අත; දහතෙ, දවයි; ශාන්තො, නිවි අඟුරු ඇල්වූ කල්හි; කරඃ, හස්තයතෙම; කෘෂ්ණායතෙ, දූලි අනගැවීමෙන් කිලිටුවෙයි.

22 නමන්ති ඵලිනො වෘක්ෂා නමන්ති විබුධා ජනාඃ
ශුෂ්කකාෂ්ඨානි මූර්ඛාශ්ච භිද්‍යන්තෙ න නමන්තිච.

22 ඵලිනඃ, පලගත්තාවූ; වෘක්ෂාඃ, වෘක්ෂයෝ; නමන්ති, නැමෙන්නාහ; විබුධාඃ, නුවනැත්තාවූ; ජනාඃ, ජනයෝත්; නමන්ති, නැමෙන්නාහ; ශුෂ්කකාෂ්ඨානි; වියලිගියාවූ දඬුද; මූර්ඛාශ්ච, කිසිවක් නොදන්නා මූර්ඛයෝද; භිද්‍යන්තෙ, බිඳෙන්නාහ; න නමන්තිච, අවවාදයට නොනැමෙන්නාහුයි.

23 ජන්මාන්තර ශතාභ්‍යස්තා විෂයෙෂු රතිර්නෘණාම්
ජරද්ගොරිව ශස්‍යෙෂු දුඃඛෙන විනිවාර්‍යතෙ.

23 ජන්මාන්තරශත, සියදහස් ගනන් ජාතියෙහි; අභ්‍යස්තා, පුරුදු කරණලද; විෂයෙෂු, රූප ශබ්ද ගන්ධ රස ස්පර්ශ යන පඤ්චකාමයෙහි;

නෘණං, මිනිසුන්ගේ; රතිඃ, ආලය; ශෂ්‍යෙෂු, ගොයමෙහි; ජරද්ගොරිව, ක්‍ෂුධාවෙන් පීඩිතවූ මහළු ගොනෙකුගේ ලොභයමෙන්; දුඃඛෙන, දුකින්; විනිවාය්‍යතෙ, වලකනුලැබේ.

24 ඉහ යත්ක්‍රියතෙ කර්‍මම තත්පරත්‍රොපභුජ්‍යතෙ
මූලෙ සික්තස්‍ය වෘක්‍ෂස්‍ය ඵලං ශාඛාසු දෘශ්‍යතෙ.

24 ඉහ, මේ ජාතියෙහි, යත්කර්‍මම, යම් කුශලාකුශල කර්‍මමයෙක්; ක්‍රියතෙ, කරණුලැබේද; තත්, ඒ කුශලාකුශල කර්‍මමයාගේ විපාකය; පරත්‍ර, පරලෙව්හිදී; උපභුජ්‍යතෙ, අනුභව කරණුලැබෙයි; ඒ එසේමැයි–මූලෙසික්තස්‍ය, මුල පැන් වත්කොට වඩනාලද; වෘක්‍ෂස්‍ය, වෘක්‍ෂයාගේ; ඵලම්, ඵලය; ශාඛාසු දෘශ්‍යතෙ, උඩ අතුවලදීම දක්නා ලැබෙයි එමෙනි.

25 අත එවහි නෙච්ඡන්ති සාධවඃ සත්සමාගමම්
සවියොගාසිලූනස්‍ය මනසො නාස්ති භෙෂජම්.

25 සවියොග, සත්පුරුෂයන්ගෙන් වෙන්වීම නමැති; අසි, ඛඩ්ගයෙන්; ලූනස්‍ය, කපන්ලද; මනසඃ, සිතට; භෙෂජම්, බෙහෙදෙක්; නාස්ති, නැද්ද; අතඃ එවහි, එහෙයින්ම; සාධවඃ, සත්පුරුෂයෝ; සත්සමාගමම්, සාධු සමාගමය; න ඉච්ඡන්ති, නොකමැතිවෙත්.

26 අදාතා පුරුෂස්ත්‍යාගී ධනං සන්ත්‍යජ්‍ය ගච්ඡති
දාතාරං කෘපණං මන්‍යෙ මෘතොප්‍යර්ථං නමුඤ්චති.

26 අදාතා පුරුෂඃ, දන් නොදෙන්නාවූ පුරුෂතෙම; ත්‍යාගී, ත්‍යාගී නම්වන්නේය; කුමක්හෙයින්දයත්–ධනම්, බාලඅවස්ථාවෙහි පටන් දුක්ගෙණ සෙවූ වස්තුව; සන්ත්‍යජ්‍ය, හැර හෙවත් අනුන්ට අනුභව කරන්ට තබාලා; ගච්ඡති, මියපරලොවයේ; එසේහෙයින්–දාතාරම්, දන්දෙන තැනැත්තාහු; කෘපණම්, ඉතා බැගෑයයි; මන්‍යෙ, සිතම්; කුම්ක්හෙයින්දයත්? මෘතොපි, මළතැනැත්තේද; අර්ථම්, වස්තුව; නමුඤ්චති, අත්නොහරින්නේයි එසේහෙයිනි.

27 නිර්ගුණෙෂ්වපි සත්වෙෂු දයාං කුර්වන්ති සාධවඃ
නහි සංහරතෙ ජ්‍යොත්ස්නාශ් චන්ද්‍රඃ චණ්ඩාලවෙෂ්මණි.

27 සාධවඃ, සත්පුරුෂයෝ; නිර්ගුණෙෂ්වපි සත්වෙෂු, සිත්ගුණ නැත්තාවූ සත්වයන්කෙරෙහිද; දයාංකුර්වන්ති, මෛත්‍රීකරන්නාහුය; ඒ එසේමැයි—චන්ද්‍රඃ, චන්ද්‍රතෙම; චණ්ඩාලවෙෂ්මණි, හීනයන්ගේ භවනයෙහිදු; ජ්‍යොත්ස්නාඃ, සඳරැස්; නහිසංහරතෙ, නොහකුළුවයි; හෙවත් පකුරුවයි.

28 අපකාරමසම්ප්‍රාප්‍ය තුෂ්‍යෙත් සාධු රසාධුතඃ
එෂලාභො භුජගෙන වෙෂ්ටිතොයං නදංශතෙ.

28 සාධුඃ, සත්පුරුෂතෙම; අසාධුතඃ, දුර්ජනයාකෙරෙන්; අප

කාරං, විනාසයට; අසම්ප්‍රාප්‍ය, නොපැමිණ; තුෂෝත්, සතුටුවන්නේය; ඒ එසේමැයි–භුජගෙන, සර්පයාවිසින්; වෙෂ්ටිතඃ, වෙළාගත්නාලදුව; නදංශතෙ, නොඩහන්නේය යන; යත්, යමෙක් ඇද්ද; එසඃ ලාභඃ, එමලාභයයි දතයුතුයි.

29 ශික්ෂයන්ති න යාචන්තෙ දෙහිදෙහිති යාචකාඃ
අදත්වා මාදෘශොමාභුද්දත්වා ත්වත් සදෘශොභව.

29 යාචකාඃ, සිඟන්නෝ; දෙහිදෙහිති, අපටදෙව අපටදෙව්යි කියා; ශික්ෂයන්ති, හික්මවන්නාහුනම්වෙති; න යාචන්තෙ, ඉල්වන්නාහුනම් නොවෙති; කුමක්කියා හික්මවද්දයත්? අදත්වා, දන් නොදී; මාදෘශොමාභුද්, මාසේනොවෙව; දත්වා, දන්දී; ත්වත්සදෘශොභව, තොපසේම් වේවයි කියා හික්මවන්නාහුනම්වෙති.

30 වලිභිර්මුඛමාක්‍රාන්තං පලිතෛඃ රංජිතං ශිරඃ
ගාත්‍රානි ශිථිලායන්තෙ තෘෂ්ණෛකා තරුණායතෙ.

30 මුඛම්, මුහුන; වලිභිඃ, රැලියෙන්; ආක්‍රාන්තම්, වලඳනාලද; ශිරඃ, හිස; පලිතෛඃ රංජිතම්, නරයෙන් රැඳීගියේය; ගාත්‍රාණි, හස්තපාදාදී අවයවයෝ; සිථිලායන්තෙ, මස්නැතිව ලිහිල්වන්නාහ; එසේවුවත්–එකාතෘෂ්ණා, පඤ්චකාම ගුණයෙහි එකතෘෂ්ණාවම; තරුණායතෙ, සගබාලවන්නීයි.

31 ඓශ්වර්‍ය්‍ය තිමිරං චක්ෂුඃ පශ්‍යත්‍යපි න පශ්‍යති
පශ්වාත්නිර්මලතාං යාති දාරිද්‍ර්‍යගුලිකාඤ්ජනෛඃ.

31 ඓශ්වර්‍ය්‍ය තිමිරං, ඉසුරුනැමැති අඳුරෙන් වලඳනාලද; චක්ෂුඃ, ඇස; පශ්‍යත්‍යපි, අනුත් දකදකත්; නපශ්‍යති, නොදක්නේය; පශ්වාත්, පසුව; දාරිද්‍ර්‍යගුලිකාඤ්ජනෛඃ, දිලිඳුබව නැමති අඳුන්ලාමැදිමෙන්; නිර්මලතාංයාති, නිර්මලබවට පැමිනෙයි ගෙවත් ඉසුරුබව නැමති ඇඳිරි නැතිව සියල්ලම දක්මට සමර්ථවන්නේයි.

32 ශත්‍රෝරපි ගුණාවාච්‍යා දෙෂාවාච්‍යා ගුරොරපි
පක්ෂපාතාද් භවෙත් පාපං දෙෂාදෙෂාඃ ගුණාගුණාඃ

32 ශත්‍රෝරපි, සතුරාගේද; ගුණාඃ, මෛත්‍රීක්ෂමොපශමාදි ගුණයෝ; වාච්‍යඃ, නොසඟවා කියයුත්තාහ; ගුරොරපි, තමාගේ ගුරුවරයාගේද; දෙෂාඃ, නුගුණයෝ; වාච්‍යාඃ, නොසඟවා කියයුත්තාහුයි; පක්ෂපාතාත්, පක්ෂපාතව සතුරාගේ ගුණ නොකීමෙන් හා ගුරුන්ගේ නුගුණ සැඟවීමෙන්; පාපම්භවෙත්, නරකයෙහි උපදනට හේතුවූ අකුසල්වන්නේය; දෙෂාදෙෂාඃ, සතුරාගේ වේවයි මිතුරාගේ වේවයි නුගුණයෝ නුගුණයෝමැයි; ගුණාගුණාඃ, ගුණයෝ ගුණයෝමැයි.

33 අසත්සම්පර්ක දෙෂෙණ සජ්ජනොපි විගහ්‍යතෙ
මාඝීහස් තිමිර සම්පර්කාත් සමොපි විෂමායතෙ.

33 අසත්සම්පර්කදෙෂෙණ, දුර්ජනයන් හා එක්වීම නැමති දෙෂ යෙන්; සජ්ජනොපි, සත්පුරුෂයාද; විගහ්‍යතෙ, නින්‍දාකරණුලැබේ; ඒ එසේමැයි–මාඝීඃ, මාඝීයතෙම; සමොපි, සමවූයේද; තිමිරසම් පර්කාත්, අඳුරුහා එක්වීමෙන්; විෂමායතෙ, නොසමවන්නේයි.

34 දුර්ජනඃ පරිහර්තවෙ‍ය විද්‍යයාලඞ්කෘතොපි සන්
මණිනාලඞ්කෘතස් සර්පඃ කිමසෞ න භයඞ්කරඃ.

34 දුර්ජනඃ, අසත්පුරුෂතෙම; විද්‍යයාලඞ්කෘතොපිසන්, ශාස්ත්‍ර නැමති පලඳනාවෙන් සැරහුනේද; පරිහර්තව්‍යඃ, පඬිතකමට නො ගෙණ දුරුකටයුත්තේය; ඒ එසේමැයි–මණිනාලඞ්කෘතඃ, සාණික්‍ය මාණික්‍යයෙන් සරහනලද්දේවිනමුත්; අසෞසර්පඃ, මේ සර්පතෙම; කිං නභයඞ්කරඃ, කුමකැයි භයඞ්කර නොවන්නේද වන්නේමැයි.*

35 පරාපවාදෙ බධිරඃ පරච්ඡිද්‍රෙෂ්ව ලොචනඃ
පඞ්ගුඃකාමේමානාහයෙර්ෂු දුස්සංකල්පෙෂුව වෙතනඃ.

35 පරාපවාදෙ, අනුන්ගේ නුගුණඇසීමෙහි; බධිරඃ, නුවනැත් තේ බිහිරක්හුවැනිවෙයි; පරච්ඡිද්‍රෙෂු, අනුන්ගේ සිදුරුදැක්මෙහි; අලොචනඃ, ඇස්නැත්තෙක්මෙන් වන්නේය; අනායෙර්ෂු කර්මේ ෂු, ප්‍රාණඝාතාදී පව්කිරීමෙහි; පඞ්ගුඃ, පිලෙක්හු වැන්නේය; දුස්සං කල්පෙෂුං නපුරක් පවක් කරන්ට සිතීමෙහි; අවෙතනඃ, සිත් නැත්තක්හුමෙන් වන්නේයි.

36 මහද්භිඃ බඞවෛරස්‍ය විපත්ති රපි ශොභනා
දන්තභඞ්ගොපි නාගානාංශ්ලාඝ්‍යෙ ගිරිවිදාරණෙ.

36 මහද්භිඃ, මහතුන්හා; බද්ධවෛරස්‍ය, බඳනාලද වෛර ඇත් තාහුගේ; විපත්තිරපි, විනාසයද; ශොභනා, හොබනීය; ඒ එසේ මැයි–නාගානාම්, ඇතුන්ගේ; ගිරිවිදාරණෙ, පර්වතපැලීමෙහි; දන්ත ගඞ්ගොපි, දළ නැසීයාමද; ශ්ලාඝ්‍යඃ, ප්‍රශංසා කටයුතුයි.

37 අසජ්ජනෙන සම්පර්කාං දනයං යාන්ති සාධවඃ
මධුරං ශීතලං තොයං පාවකං ප්‍රාප්‍ය නිර්ගුණම්.

37 සාධවඃ, සත්පුරුෂයෝ; අසජ්ජනෙන, අසත්පුරුෂයන්හා;

---

* ගතු ගතුද ලදනෝ සහ කටමැණ සපුන්මෙන්
පිරිරඹු නිරිඳු මලද පරනට බියම රුකුලෝ.*

අසත්පුරුෂයෝ ශාස්ත්‍ර උගත් නමුත් ගෙල පලන් මිණිරුවනින් හෙබි නාගයන්සෙයින් හරෙන්‍ඳනැමති වන්‍ඳන වාක්‍යය වෙලාගෙණ අනුන්ට භයම කෙරෙති.

සම්පර්කාත්, එකතුවීම හෙතුකොටගෙණ; අනයංසාන්ති, නොකටයුත්තට පැමිණෙන්නාහුයි; ඒ එසේමැයි–මධුරම්, මධුරවූ; ශීතලම්, සිහිල්වූ; තොයම්, ජලය; පාවකංප්‍රාප්‍ය, ගින්නට පැමිණ; නිර්ගුණං (භවති), මධුර ශීතලාදී ගුණ නැතිවන්නේයි.

38 සුඛස්‍යානන්තරං දුඃඛං දුඃඛස්‍යානන්තරං සුඛම්
චක්‍රවත් පරිවර්තන්තෙ දුඃඛානිච සුඛානිච.

38 සුඛස්‍ය, සුව අනුභවකිරීමට; අනන්තරම්, ඉක්බිතිව; දුඃඛම්, දුක්වන්නේය; දුඃඛස්‍ය, දුක් අනුභවකිරීමට; අනන්තරම්, අනතුරුව; සුඛම්, සැප විඳීමවන්නේය; දුඃඛානිච, දුඃඛයෝද; සුඛානිච, සැපයෝද; චක්‍රවත්, රථසකක්මෙන්; පරිවර්තන්තෙ, එපිට මෙපිට පෙරළෙන්නාහුයි.

39 නවිෂං විෂ මිත්‍යාහුර් බ්‍රහ්මස්වං විෂමුච්‍යතෙ
විෂමෙකාකිනං හන්ති බ්‍රහ්මස්වං පුත්‍රපෞත්‍රකම්.

39 විෂම්, සර්පාදි විෂ; විෂමිති, විෂයයි; නාහුඃ, නොකියති; බ්‍රහ්මස්වම්, බ්‍රාහ්මණ සන්තක හෝ ධර්මසන්තක හෝ රාජසන්තක හෝ වස්තුව; විෂමුච්‍යතෙ, විෂයයි කියනුලැබේ; විෂම්, සර්පාදි විෂතෙමේ; ඒකාකිනම්, තනිකෑතැනැත්හුම; හන්ති, නසයි; බ්‍රහ්මස්වම්, බ්‍රාහ්මණාදි කිසිවක් අයිති වස්තුව; පුත්‍රපෞත්‍රකම්, දරුමුණුබුරණුත් නසයි.

40 දෙහීති වචනං කෂ්ටං නාස්තීති වචනං තථා
දෙහි නාස්තීතිවා වාක්‍යං මාභූද් ජන්මනි ජන්මනි.

40 දෙහීති වචනම්, අපට බත් පිළි ආදිය දෙවයි යාචකව අනුන්ගෙන් යම්දෙයක් ඉල්වීමත්; කෂ්ටම්, කෂ්ටය හෙවත් නපුරුය; නාස්තීති වචනම්තථා, නැතැයි යන වචනයත් එසේම නපුරුය; දෙහිනාස්තීතිවා වාක්‍යම්, අපට දෙවයි යන බසෙක්වේවයි තමාගේ ගෙදෙරට සිහාගොයා ආ යාචකයන්ට නැතැයි යන බසෙක් වේවයි; ජන්මනි ජන්මනි, ජාතිජාතියෙහිත් මාභූත්, නොවේවා.

41 ආගමාදෙව නරකාඃ ශ්‍රූයන්තෙ රෞරවාදයඃ
විෂයිත්වං දරිද්‍රාණං ප්‍රත්‍යක්ෂං නරකං විදුඃ.

41 රෞරවාදයඃ, රෞරව නරකය ආදිකොට ඇති; නරකාඃ, නරකයෝ; ආගමාත් එව, ශාස්ත්‍රාගමයෙන්ම; ශ්‍රූයන්තෙ, අසනුලැබෙති; දරිද්‍රාණම්, දිළිඳු මිනිසුන්ගේ; විෂයිත්වම්, පඤ්චකාමගුණ අත්කිරීමෙහි ලොභය; ප්‍රත්‍යක්ෂම්, මේ ආත්මභාවයෙහි ප්‍රත්‍යක්ෂවූ; නරකම්, නරකයැයි; විදුඃ, නුවනැත්තෝ දනිති.

42 නිර්ධනශ්චාපි කාමාර්ථී දුර්බලඃ කලහප්‍රියඃ
මන්දශාස්ත්‍රො විවාදාර්ථී ත්‍රිවිධං මූර්ඛලක්ෂණම්.

42 නිර්ධනශ්චාපි, වස්තු නැතිවත්; කාමාර්ථී, පඤ්චකාමානුභවයට සිතන තැනැත්තේද; දුර්බලඃ, කායබල ඥානබල සේනාබල සහාය බලයක් නැතිව; කලහප්‍රියඃ, ඩබරකරණ අභිප්‍රාය ඇත්තේද; මන්දශාස්ත්‍රඃ, වැඩි අකුරක් ශාස්ත්‍රයක් නොදත; විවාදාර්ථී, අනුන්හා වාදකරණු කැමැත්තේද; ත්‍රිවිධම්, මෙකී ප්‍රකාර තුන්දෙන; මූර්ඛලක්ෂණම්, අඥානයන්ගේ ලක්ෂණයි.

43 අනාහූතෙ ප්‍රවෙශශ්ච න පෘෂ්ටො බහුභාෂණම්
ස්තුතිශ්ච ස්වාත්ම වර්ණස්‍ය ඉත්‍යෙවම් මූර්ඛලක්ෂණම්.*

43 අනාහූතෙප්‍රවෙශශ්ච, නොකැඳවූ කල්හි අනුන්ගේ ගෙටවැදීමද; නපෘෂ්ටෙ, කිසිවක් නොවිචාළකල්හි; බහුභාෂණම්, බොහෝ කොට දෙඩීමද; ස්වාත්මවර්ණස්‍ය, තමාගේ ප්‍රඥවහා කුලයගේ; ස්තු තිශ්ච, අනුන් ඉදිරියෙහි ස්තුතිකිරීමද; ඉත්‍යෙවම්, යනමේ තුන් ආකාරය; මූර්ඛලක්ෂණම්, අඥනයන්ට ඇති ලක්ෂණ වන්නේයි.

44 දානං විභූෂණං ලොකෙ දානං දුඃඛ නිවාරණම්
දානං ස්වර්ගස්‍ය සොපානං දානං ශාන්තිකරං සුඛම්.

44 ලොකෙ, මේ ලොකයෙහි; දානම්, දන්දීම; විභූෂණම්, තමා පැ ලඳගත් ආභරණයක්වැන්න; දානම්, දන්දීම; දුඃඛනිවාරණම්, ස තරඅපායෙහි ඉපදීමත් වළකන්නේය; දානම්, දන්දීම; ස්වර්ගස්‍ය සොපානම්, දෙව්ලොවට නැඟෙණ හිණක් වැන්න; දානම්, දන්දීම; ශාන්තිකරම්, නිවන්සැප සිද්ධකරන්නාවූ; සුඛම්, මහත් සුඛයකි.

45 මනසා චින්තයිත්වාපි යොනදද්‍යාත් පුනර්නරඃ
ස ප්‍රෙතො භවතීත්‍යුක්ත මල්පමාත්‍රෙණ වස්තුනා.

45 මනසා, සිතින්; චින්තයිත්වාපි, දන්දෙමියි සිතාත්; යොනරඃ, යම් සත්ත්වකෙනෙක්තෙම; පුනඃ, නැවත; නදද්‍යාත්, දන් නොදෙන් වීනම්; අල්පමාත්‍රෙණ වස්තුනා, මඳ වස්තුවකින් වියදම්කරන්ට ලොභකොට; සඃ, එතෙම; ප්‍රෙතොභවති, ලොභාධිකවූ අකුශල ක ර්මබලයෙන් ප්‍රෙතව උපදනේයයි, උක්තම්, කියනලදී.

46 දොෂොප්‍යස්ති ගුණොප්‍යස්ති නිර්දෝෂො නෛව ජායතෙ
සුකුමාලස්‍ය පද්මස්‍ය නාලොභවති කණ්ටකඃ.

46 දොෂොප්‍යස්ති, එකෙකුගේ වරදකුත් ඇත; ගුණොප්‍යස්ති, ගු ණයකුත් ඇත; නිර්දෝෂඃ, වරදක්.නැති එකෙක්; නෛවජායතෙ, නූපදනේයි; ඒ කෙසේදයත්–සුකුමාලස්‍ය පද්මස්‍ය, ඉතා මොළොක් වූ පද්මයාගේ; නාලඃ, දඬුව; කණ්ටකො භවති, කටුසහිත කොරසැඩි වන්නේයි.

47 ඥනවෘද්ධා වයොවෘද්ධාස්තපොවෘද්ධාශ්ච යෙ නරාඃ
සර්වේ තෙ ධන වෘද්ධස්‍ය ද්වාරෙ තිෂ්ඨන්ති කාතරාඃ.

47 ඥණවෘද්ධාඃ, නුවනින් වැඩිසිටියාවූද; වයොවෘද්ධාඃ, වයසින් වැ ඩිසිටියාවූද; තපොවෘද්ධාශ්ච, තපසින් වැඩිසිටියාවූද; යෙනරාඃ, යම් සත්ත්වකෙනෙක් ඇත්නම්; සර්වේතෙ, එව්හු සියල්ලම; ධනවෘද්ධස්‍ය, වස්තුවෙන් වැඩිසිටියාහුගේ; ද්වාරෙ, දොරකඩ; කාතරාඃ, බැගෑපත් ව; තිෂ්ඨන්ති, සිටිති.

---

* අනාහූතො විශෙද්‍යස්තු නපෘෂ්ටො බහුභාෂතෙ
ආත්මානං මන්‍යතෙ ප්‍රීතං භූපාලස්‍ය ස දුර්මතිඃ–හිතොපදෙශයි

48 මාතෘවත්පරදාරාණි පරද්‍රව්‍යාණි ලොෂ්ටවත්
ආත්මවත්සර්වභූතානි යඃ පශ්‍යති සපශ්‍යති.*

48 පරදාරාණි, මෙරමාසන්තක අඹුවන්; මාතෘවත්, තමාගේ මව මෙන්ද; පරද්‍රව්‍යාණි, අනුන් සන්තක වස්තූන්; ලොෂ්ටවත්, කැට කැබිලිතිමෙන්ද; සර්වභූතානි, සියලු සත්වයන්; ආත්මවත්, තමා මෙන්ද; යඃ, යම් සත්වකෙනෙක්තෙමේ; පශ්‍යති, දකීද; සඃ, ඒ සත්ව තෙම; පශ්‍යති, සියල්ලම දක්නේ නම්වේ.

49 කොකිලානං ස්වරං රූපං නාරීරූපං පතිව්‍රතම්
විද්‍යාරූප මරූපාණං † ක්ෂමාරූපං තපස්විනාම්.

49 කොකිලානාම්, පුරවිකෙවිල්ලන්ට; රූපම්, රූපනම්; ස්වරම්, උන්ගේ මධුරවූ නාදයවන්නේය; පතිව්‍රතම්, පතිව්‍රතා ධර්මය රක්ෂා කිරීම; නාරීරූපම්, ස්ත්‍රීන්ට රූපනම් වන්නේය; අරූපාණම්, රූව නැත්තන්ට; විද්‍යාරූපම්, තමන් උගත් ශාස්ත්‍රය රූපනම්වන්නේය; තපස්වි නාම්, තපස්වීන්ට; ක්ෂමාරූපම්, ඉවසීම රූපනම් වන්නේයි.

50 රාගොනාම මනශ්ශල්‍යො ගුණද්‍රවිණතස්කරඃ
රාහුර්විද්‍යා ශශාඞ්කස්‍ය තපොවන හුතාසනඃ.

50 රාගොනාම, රාගයනම්; මනශ්ශල්‍යඃ, සිතට වේදනා උපදවන ලෙහි ඇනි උලක් වැන්න; ගුණද්‍රවිණ, ගුණනැමති වස්තු පැහැර ගැන්මට; තස්කරඃ, සොරෙකුවැන්න; විද්‍යාශශාංකස්‍ය, ශාස්ත්‍ර ඉගැණීම් නැමති චන්ද්‍රයා ගලනට; රාහුඃ, අසුරෙන්ද්‍රයා වැන්නේය; තපොවන, තපස්නැමති වනය දවා භස්මකරන්ට; හුතාසනඃ, ගිනි කඳක්වැන්නේයි.

51 රූපයෞවන සම්පන්නා විශාලකුල සම්භවාඃ
විද්‍යාහීනා නශොභන්තෙ නිර්ගන්ධා ඉව කිංශුකාඃ.

51 රූපයෞවනසම්පන්නාඃ, රුවින්හා තරුණකමින් යුක්තවූ; විශාලකුලසම්භවාඃ, මහත් ප්‍රසිද්ධවූ වංශඇත්තෝවීනමුත්; විද්‍යාහීනාඃ, කිසි ශාස්ත්‍රයක් නොදනිත්නම්; නශොභන්තෙ, නොහොබනාහුයි; කුමක්මෙන්දයත්–නිර්ගන්ධාඃ, සුවඳනැත්තාවූ; කිංශුකාඃ ඉව, කැළෑ මල්මෙනි.

52 අසන්තුෂ්ටො යතිර්නෂ්ටඃ සන්තුෂ්ටශ්ච මහීපතිඃ
සලජ්ජා ගණිකා නෂ්ටා නිර්ලජ්ජා ච කුලාඞ්ගනා.

52 අසන්තුෂ්ටඃ, ලදදෙයකින් සතුටුනොවන්නාවූ; යතිඃ, තපස්වී තෙමද; නෂ්ටඃ, නටුයේනම්වෙයි; සන්තුෂ්ටශ්ච, ලදදෙයකින් සතුටු වන්නාවූ; මහීපතිඃ, රජද නටුයේවෙයි; සලජ්ජා, විළිඇත්තාවූ; ගණිකා, වෙශ්‍යාවද; නෂ්ටා, නටුවානම් වන්නීය; නිර්ලජ්ජා ච, විළි නැත්තාවූ; කුලාඞ්ගනා, කුල ස්ත්‍රීයද නටුවානම් වන්නීය.

---

* මාතෘවත්පරදාරෙෂු පරද්‍රව්‍යෙෂු ලොෂ්ටවත්
ආත්මවත්සර්වභූතෙෂු යඃ පශ්‍යති සපණ්ඩිතඃ.

† විද්‍යාරූපං කුරූපාණං—හිතොපදෙශයි.

53 කෘතස්‍ය කරණං නාසති ප්‍රාගෙවාතඃ පරීක්ෂ්‍යතාම්
අවිචින්ත්‍ය කෘතං කර්‍මම පශ්චාත්තාපාය වර්‍තතෙ.

53 කෘතස්‍ය, කළදෙයට; කරණම්, කලමණාදෙයක්; නාසති නැත; අතඃ, එහෙයින්; ප්‍රාගෙව! කටයුත්තක් කරන්නට පළමුකොට ම; පරීක්ෂ්‍යතාම්, ඉන්වන වැඩ අවැඩ සිත තබා පරීක්ෂාකරණු ලැබේවා; අවිචින්ත්‍ය, සඟපත නපුර නොසලකා; කෘතංකර්‍මම, කළ කටයුත්ත; පශ්චාත්තාපාය මා කළසේ නපුරැයි පසුතැවිළි පිණිස; වර්‍තතෙ, පවතී.

54 ශාස්ත්‍රකාව්‍ය විනොදෙන කාලොගච්ඡති ධීමතාම්
ව්‍යසනෙන ච මූර්‍ඛාණං නිද්‍රයා කලහෙන වා.

54 ධීමතාම්, නුවනැත්තවුන්ට; ශාස්ත්‍රකාව්‍ය විනොදෙන, තර්‍කවාකරණාදී ශොෂ්ඨියෙන්හා කාව්‍යනාටකාදීන්ගේ ඉගණීමෙන්; කාලොගච්ඡති, දවස්යන්නේය; මූර්‍ඛාණම්, නුවනනැති මූර්‍ඛයන්ට; ව්‍යසනෙනච, දූකෙළිම් ආදියෙන්ද; නිද්‍රයා, දවස මුළුල්ලෙහි නිදීමෙන්ද; කලහෙනවා, දුටුදුටුවන්හා ඩබරකිරීමෙන්ද; (කාලොගච්ඡති, දවස් යන්නේයි.)

55 භුක්ත්වා නිෂීදතඃ ස්ථෞල්‍යං තිෂ්ඨතො බලවර්‍ධනම්
ආයුශ්චර්‍ඞ්ක්‍රමතො නිත්‍යං මෘත්‍යුර්‍ධාවති ධාවතඃ.

55 භුක්ත්වා, බත් අනුභවකොට; නිෂීදතඃ, ඉන්නාහට; ස්ථෞල්‍යම්, ස්ථූලබවද; තිෂ්ඨතඃ, බත්කා සිටින්නාහට; බලවර්‍ධනම්, ශරීර බල වැඩීමද; චඞ්ක්‍රමතඃ, බත්කා සක්මන්කරන්නාහට; ආයුඃ, ආයුෂයද; ධාවතඃ, බත්කා දිවන්නාහට; මෘත්‍යුඃ, මරණයද; නිත්‍යම්, නිරන්තරයෙන්; ධාවති, පසුපස්සෙහි දුවන්නේයි.

56 ප්‍රස්තාව සදෘසං වාක්‍යං සද්භාව සදෘශං ප්‍රියම්
ආත්මශක්ති සමං කොපං යොජ්ජානාති සපණ්ඩිතඃ.

56 ප්‍රස්තාවසදෘශංවාක්‍යම්, ප්‍රාප්තකාලයට සුදුසු කථාකිරීමද;සද්භාවසදෘසංප්‍රියං, පණ්ඩිතභාවයට සුදුසුවූ ප්‍රියතෙපුල් කීමද; ආත්මශක්ති සමංකොපම්, තමාගේ බලවූ නියාවට සුදුසු කෝපයද; යොජ්නාති, යම්මෙක් දන්නේවීනම්;සඃ, ඒතෙම; පණ්ඩිතඃ, නුවනැත්තේනම් වෙයි.

57 පරලොකො'ස්තු වා මා වා ත්‍යජ්‍ය මෙවාශුභං බුධෛඃ
යදී නාසති තතඃ කිංස්‍යාත් අස්තිචෙන්නාස්තිකො හතඃ.

57 පරලොකඃ, පරලොව; අස්තුවා, ඇතිහෝවේවා; මාවා, නැතිහෝවේවා; බුධෛඃ, නුවනැත්තන් විසින්; අශුභම්, අකුසලය; ත්‍යජ්‍යමෙව,හළයුත්තේමය; යදි, ඉදින්; නාසතී, නැත්තේවීනම්; තතඃ කිංස්‍යාත්, ඉන් කුමන වරදෙක්ද; අස්තිචෙත්, ඉදින් පරලොව ඇත්තේනම්; නාස්තිකඃ, නැතැයි පව්කළ තැනැත්තේ; හතඃ, නටුයේනම්වේ හෙවත් පැරැද්දේනම්වේ.

58 විචක්ෂණා නාපක්ෂණා නෛවතුල්‍යං කදාචන
ස්වදෙශෙ පූජ්‍යතෙ රාජා විද්වාන් සර්‍වත්‍ර පූජ්‍යතෙ.

58 විද්වත්වඤ්ච,පණ්ඩිතකමද; නෘපත්වඤ්ච,රජකමද; කදාචන, කිසිකලෙකත්; නෛවතුල්‍යම්, නොසමවන්නේමැයි; කුමක්හෙයින්දයත් රාජා, රජතෙම; ස්වදෙශෙපූජ්‍යතෙ, තමාගේ රට බොහෝදෙනා විසින් සම්භාවනාකරණුලබන්නේයි; විද්වාන්, පණ්ඩිතතෙම;සර්වත්‍රපූජ්‍යතෙ, සියලු රටවලදීම බොහෝදෙනාවිසින් සම්භාවනාකරණුලැබේ.

59 යඃ කරොති නරඃ පාපං තතඃ ස්වාත්ම වධප්‍රියඃ
ආත්මනා නිචිතං පාපං නාන්‍යෛරෙවොපභුජ්‍යතෙ.

59 යඃනරඃ, යම් සත්වකෙනෙක්තෙම; පාපං කරොති, පව්කෙරේද; තතඃ, ඒකාරණයෙන්; ස්වාත්මවධප්‍රියඃ, තමාහට වධකිරීමෙහි ප්‍රිය වන්නේයි; ඒ එසේමැයි-ආත්මනානිචිතං, තමාවිසින් රැස්කරණලද; පාපම්, පාපය; අන්‍යෛඃ, සෙස්සවුන් විසින්; නෛව උපභුජ්‍යතෙ, නොම අනුභවකරණුලැබේ.

60 දෙහීති වචනද්වාරා දාත්මස්ථාඃ පඤ්චදෙවතාඃ
සද්‍යොනිර්යාන්ති තං ත්‍යක්ත්වා ශ්‍රී ශ්‍රී ධී ධෘති කීර්තයඃ.

60 දෙහීතිවචනද්වාරාත්, දෙවයි යන වචන නැමති දොරකඩින්; ආත්මස්ථාඃ, තමාගේ ඇතුලත පිහිටියාවූ; පඤ්චදෙවතාඃ, දෙවියෝ පස්දෙනෙක්; සද්‍යඃ, එකණෙහිම; තම්, ඔහු; ත්‍යක්ත්වා, හැර; නිර්යාන්ති, නික්ම බැහැර පලායෙති; එව්හු කවරහයත්; ශ්‍රී, ලජ්ජාවය;ශ්‍රී, ශ්‍රීකාන්තාවය; ධී, නුවණය; ධෘති, ධෛර්‍ය්‍යය; කීර්තයඃ, කීර්තිය යන මොහු පස්දෙනායි.

61 න කශ්චිත් කෘපණෙනාම දාතාපි කෘපණයතෙ
අර්ජිතො භාග්‍යශෙෂෙණ දාතාපි කෘපණයතෙ·

61 කෘපණෙනාම, බැගෑනම්වූ කශ්චිත්, කිසිවෙක්; න, නැත්තේය; දාතාවාපි, ත්‍යාගීඑකෙක් හෝ; න විද්‍යතෙ, නැත්තේය; අර්ජිතොභාග්‍යශෙෂෙණ, ලබන්නාහුගේ දෛවශෙෂයෙන්; දාතාපි, ත්‍යාගිතැනැත්තේද; කෘපණයතෙ, බැගෑවන්නේයි.

62 ජන්මාන්තර සහස්‍රෙෂු වියොගඃ සහසඞ්ගමඃ
තථාප්‍යති ක්ෂීණචෙතඃ ප්‍රියසඞ්ගම මීහතෙ.

62 ජන්මාන්තරසහස්‍රෙෂු, දහස්ගණන් ජාතියෙහි; වියොගඃ, වෙන්වීමද; සහසඞ්ගමඃ, එක්වීමද; (ක්ෂණත්, වහාම වන්නේමැයි) ;තථාපි, එසේදඋවත්; අතික්ෂීණචෙතඃ, ඉතා බැගෑවූසිත; ප්‍රියසඞ්ගමං, ප්‍රිය සඞ්ගමය; ඊහතෙ, ප්‍රාර්ථනා කෙරෙයි.

63 සංසාරවිෂ වෘක්ෂස්‍ය ද්වයමෙවා මෘතං ඵලං *
සුභාෂිතරසාස්වාදස් සජ්ජනෛස් සහ සඞ්ගමඃ.

63 සංසාරවිෂවෘක්ෂස්‍ය, සංසාර නැමති විෂවෘක්ෂයාගේ; අමෘතං ඵලම්, අමාඵලය; ද්වයමෙව, දෙකෙක්මය; ඒ කවරේදයත්-සුභාෂිත රසාස්වාදඃ, මනා වචනයාගේ රසවිඳගැන්මද; සජ්ජනෛඃ සහ සඞ්ගමඃ, සත්පුරුෂයන්හා එක්වීමද යන මේ දෙකයි.

64 ත්‍යජ දුර්ජනසංසර්ගං භජ සාධු සමාගමම්
කුරු පුණ්‍ය මහොරාත්‍රං ස්මර නිත්‍යමනිත්‍යතාම්.

---

* ද්වෙ එව මධුරෙ ඵලෙ—හිතොපදෙශ.

64 දුර්ජනසංසර්ගම්, දුර්ජනයන්ගේ එක්වීම; ත්‍යජ, හරෑ; සාධු ස මාගමම්, සත්පුරුෂයන්ගේ එක්වීම; භජ, සේවනයකර; අහොරා ත්‍රම්, රෑදවල් දෙක්හිම; පුණ්‍යංකුරු, පින්කර; අනිත්‍යතාම්, සියලු සංස්කාර ධර්මයන්ගේ අනිත්‍යබව; නිත්‍යම්, නිරන්තරයෙන්; සම ර, සිහිකර.

65 යද්‍යනර්ථෙෂු සාමාර්ථ්‍ය මර්ථෙෂ්වපි ච විද්‍යතෙ
හස්තස්ථං නභවෙත් කස්‍ය සර්වං සෞගතං පදම්.

65 අනර්ථෙෂු, අවැඩ කිරීමෙහි; සාමර්ථ්‍යම්, පොහොසත්බව; යදි, ඉදින්; අර්ථෙෂුඅපිච විද්‍යතෙ, වැඩකිරීමෙහිත් වේනම්; සර්වියම්, සියළු සත්වයන්ට හිතවූ සෞගතංපදම්, සර්වඥ පදවිය; කස්‍ය, කවරක් හට; හස්තස්ථංනභවෙත්, අත්පත් නොවන්නේද; හස්තප්‍රාප්ත වන්නේමැයි.

66 ශාස්ත්‍රාවිවෙකෙ යද්දුඃඛං තද්විවෙකෙ ච යත්සුඛම්
නරකෙ ස්වර්ගලොකෙ වා න තද්දුඃඛං න තත්සුඛම්.

66 ශාස්ත්‍රවිවෙකෙ, ශාස්ත්‍රයාගේ තත්වය නොදැන්මෙහි; යද්දුඃඛම්, යම් දුකෙක් ඇද්ද; තද්විවෙකෙච, ඒ ශාස්ත්‍රයාගේ තත්වය දැන්මෙ හි; යත්සුඛම්, යම් සැපයෙක් ඇද්ද; තද්දුඃඛම්, එසේවූදුකෙක්; න රකෙවා, නරකයෙහිත්; න, නැත; තත්සුඛම්, ඒ සැපය; ස්වර්ග ලොකෙවා, දිව්‍යලොකයෙහිත්; න, නැතැයි දත්නාලදී.

67 අව්‍යවස්ථිත චිත්තස්තු ප්‍රසන්නොපි භයඞ්කරඃ
ව්‍යවස්ථිතඃ ප්‍රසන්නාත්මා කුපිතොප්‍ය භයංකරඃ.

67 අව්‍යවස්ථිත චිත්තස්තු, චපලවූ සිත්ඇත්තේ වනාහි; ප්‍රසන් නොපි, ප්‍රසන්නවූයේද; භයංකරඃ, භය එලවන්නේයි; ව්‍යවස්ථිතඃ, ශික්ෂිතවූ; ප්‍රසන්නාත්මා, ප්‍රසන්න සිත් ඇත්තේ; කුපිතොපි, කිපි යේනමුත්; අභයඞ්කරඃ, භය එලවන්නේ නොවෙයි.

68 විපත්තෞ කිං විෂාදෙන සම්පත්තෞ විස්මයෙනකිම්
භවිතව්‍ය භවත්‍යෙ ච කර්මණා මීදෘශීගතිඃ.

68 විපත්තෞ, විනාසයෙහි; විෂාදෙනකිම්, කනස්සළුවීමෙන් කා රිය කිම්ද; සම්පත්තෞ, සම්පත්තියක් ඇතිකල්හි; විස්මයෙනකිම්, ආශ්චර්යවීමෙනුත් කාරිය කිම්ද; භවිතව්‍යම්, වියයුත්තක්; භවත්‍යෙ ච, වන්නේමැයි; කර්මණාංගතිඃ, කුසලාකුසලයන්ගේ පැවැත්ම; ඊ දෘශී, මෙබඳුමැයි.

69 කොතිභාරස්සමර්ථානාං කිං දූරං ව්‍යවසායිනාම්
කොවිදෙශස් සුවිද්‍යානාං කඃ පරඃ ප්‍රියවාදිනාම්.

69 සමර්ථානාම්, පෙහොසතුන්ට; කඃඅතිභාරඃ; අධිකවූ බරෙක්න ම් කවරේද; ව්‍යවසායිනාම්, තත්පරකම් ඇත්තවුන්ට; කිං දූරම්, දු රතම් කවරෙද;සුවිද්‍යානාම්, යහපත්විද්‍යා දන්නවුන්ට; කොවිදෙශඃ, නොරට නම් කවරේද; ප්‍රිය වාදිනාම්, ප්‍රියතෙපුල් කියන්නවුන්ට; කඃපරඃ, සතුරුනම් කව්රුද.

70 ආචාරඃ කුල මාඛ්‍යාති දෙශමාඛ්‍යාති භාෂණම්
සම්භ්‍රමඃ ස්නෙහ මාඛ්‍යාති වපුරාඛ්‍යාති භොජනම්.

70 ආචාරඃ, වසනසැටිය; කුලමාඛ්‍යාති, යහපත් නපුරු කුලය ප්‍රකාශකරන්නේය; භාෂණම්, බණනබස; දෙශමාඛ්‍යාති, තමාගේරට ප්‍රකාශකරන්නේය; සම්භ්‍රමඃ, දුටුකල ඇති ආදරය; ස්නෙහමාඛ්‍යාති, ප්‍රේමය පහළකරන්නේය; වපුඃ, ශරීරයතෙමේ; භොජන මාඛ්‍යාති, අනුභවකළ ආහාරයාගේ; යහපත නපුර ප්‍රකාශකරන්නේය.

71 අලසො මන්දබුද්ධිශ්ච සුඛිතො ව්‍යාධි පීඩිතඃ
නිද්‍රාලුඃ කාමුකශ්චෙති ෂඩෙතෙ ශාස්ත්‍රවර්ජිතාඃ.

71 අලසඃ, මැලිතැනැත්තේද; මන්දබුද්ධිශ්ච, නුවනමද තැනැත්තේද; සුඛිතඃ, සුවපත් තැනැත්තේද; ව්‍යාධිපීඩිතඃ, ලෙඩින් පෙළෙන තැනැත්තේද; නිද්‍රාලුඃ, බොහෝකොට නිදන තැනැත්තේද; කාමුකශ්චෙති, කාමුකතැනැත්තේදැයි යන; එතෙෂට්, මොහු සදෙන; ශාස්ත්‍රවර්ජිතාඃ, ශාස්ත්‍ර ඉගැන්මට අසමර්ථවන්නාහුයි.

72 කර්තුමිෂ්ටමනිෂ්ටං වා කඃ ප්‍රභුර්විධිනා විනා
කර්තාරමන්‍යමාරොප්‍ය ලොකඃ තුෂ්‍යති කුප්‍යති.

72 ඉෂ්ටංවා, වැඩෙක්වේවයි; අනිෂ්ටංවා, අවැඩෙක්වේවයි; කර්තුම්, කරන්නට; විධිනාවිනා, දෛවාදෛව දෙදෙනාහැර; කඃප්‍රභුඃ, කවරෙක් පොහොසත්ද; ලොකඃ, ලෝවැසිතෙම; අන්‍යං කර්තාරම් ආරොප්‍ය, මේ අවැඩකළේ අසවිල්ලු අසවල්ලුයයි අනික්කෙනෙකුන්ගේ ද්වේෂාද්වේෂ සිතාගෙණ; තුෂ්‍යති, සතුටුවන්නේය; කුප්‍යති, (අනික්කෙනෙකුන්ගේ ද්වේෂාද්වේෂ සිතා) කිපෙන්නේයි.

73 කිඞ්කරොති ගුණෞඝස්තෙ සරාවපුටදීපවත්
වසුධාම්බරපර්‍ය්‍යන්ත විනිවාරිතගොචරඃ.

73 වසුධාම්බරපර්‍ය්‍යන්ත, යටින් පොළවහා උඩින් ආකාසය කෙළවරකොටඇති අතුරින්; විනිවාරිත, වළකනලද; ගොචරඃ, විෂය ඇති; තෙ, තාගේ; ගුණෞඝඃ, ගුණසමූහයතෙම; සරාවපුට දීපවත්, මලාදෙකකින් වසනලද ප්‍රදීපයක්මෙන්; කිංකරොති, කුමක් කරන්නේද.

74 අපිචණ්ඩානිලොද්ධූත තරඞ්ගස්‍ය මහොදධෙඃ
ශක්‍යෙත ප්‍රසරො රොද්ධුං නානුසක්තස්‍ය චෙතසඃ.

74 චණ්ඩානිලොද්ධූත, ප්‍රචණ්ඩවාතයෙන් කම්පාකරණලද; තරඞ්ගස්‍ය, රළඇති; මහොදධෙඃ, මහාසමුද්‍රයාගේ; ප්‍රසරඃ, වේගය; රොද්ධුම්, වළකන්නට; ශක්‍යෙතඅපි, පොහොසත්වනුලැබේනමුත්; අනුසක්තස්‍ය, එක්කෙනෙකුන් කෙරෙහි ඇළුනු; චෙතසඃ, සිත්හුගේ වේගය; න, වලකන්නට නොහැකිවනු ලැබේ යනුභාවයි.

75 සභායාං යොෂිතාං මධ්‍යෙ බහවඃ ඛඞ්ගධාරිණඃ
අසිසඞ්ඝට්ටසඤ්ජාත විස්ඵුලිඞ්ගෙෂු දුර්ලභාඃ.

75 සභායාම්, සභාවෙහිද; යොෂිතාම් මධ්‍යෙ, ස්ත්‍රීන්ගේ සභාවෙහිද; ඛඩ්ගධාරිණඃ, කඩුගත් අත්ඇත්තෝ; බහවඃ, බොහෝය; අසිසඞ්ඝට්ට, කඩුවෙන් කඩුව ගැටීමෙන්; සඤ්ජාත, හටගත්තාවූ; විස්ඵුලිඞ්ගපුඤ්ජ, ගිනිපුපුරුඇති යුධභූමින්හි; දුර්ලභාඃ, කඩුගත් අත්ඇත්තෝ දුර්ලභයෝයි.

76 ම්‍රියතෙ මානමාපන්නො නච යාති පරාභවම්
ශිලාස්ථම්භො'තිභාරෙණ භිද්‍යතෙ නෛව නම්‍යතෙ.

76 මානමාපන්නඃ, අභිමානයට පැමිණි සත්ත්වතෙමේ; ම්‍රියතෙ, මියනුලැබේ; නමුත්–නචයාති පරාභවම්, අනුන්ගෙන් නින්දාවට නොපැමිනෙන්නේයි; ඒ එසේමැයි–අතිභාරෙණ, අධිකවූ බරින්; ශිලාස්ථම්භඃ, ගල්ටැඹ; භිද්‍යතෙ, බිඳීයන්නේය; නෛවනම්‍යතෙ, කිසිකලෙකත් නොනැමේමැයි.

77 සාධවොයාදෘශා ලොකෙ සාගරා නහි තාදෘශාඃ
සාධවඃ පාන්ති මර්‍යාදාං යුගාන්තෙපි න සාගරාඃ.

77 ලොකෙ, මේ ලොකයෙහි; සාධවඃ, සත්පුරුෂයෝ; යාදෘශාඃ, යම් බඳුවෙද්ද; සාගරාඃ, සප්තසාගරයෝ; නහිතාදෘශාඃ, එබන්දෝ නොවෙති; කුමක්හෙයිනදයත්–සාධවඃ, සත්පුරුෂයෝ; මර්‍යාදාම්, ව්‍යවස්ථාව; පාන්ති, රකිති; සාගරාඃ, සප්තසාගරයෝ; යුගාන්තෙපි, කල්පාන්තයෙහි නමුත්; න මර්‍යාදා, නොහොත් වෙරල නොරකිත් හෙවත් වෙරල ඉක්මෙත්.

78 සර්පඃ ක්‍රූරඃ ඛලඃ ක්‍රූරඃ සර්පාත්ක්‍රූර තරඃ ඛලඃ
මන්ත්‍රෞෂධවශාත්සර්පඃ ඛලඃ කෙනොපශාම්‍යතෙ.

78 සර්පඃ, සර්පයාත්; ක්‍රූරඃ, රළුය; ඛලඃ, දුර්ජනයාත්; ක්‍රූරඃ, රළුය; ඛලඃ, එසේවූවත් දුර්ජනතෙම; සර්පාත්, සර්පයාට වඩා; ක්‍රූරතරඃ, ඉතා රළුය; කුමක්හෙයින්දයත්–සර්පඃ, සර්පතෙම; මන්ත්‍රෞෂධවශාත්, මන්ත්‍රෞෂධ බලයෙන්; උපශාම්‍යතෙ, සංසිඳුවනුලැබේ; ඛලඃකෙනොපශාම්‍යතෙ, දුර්ජනයා කුමකින් සංසිඳුවනුලැබේද නොසංහිඳෙන්නේමැයි.

79 හෘදයෙ යස්‍ය රොමාණි නසන්තිච කපොලයොඃ
තෙන මෛත්‍රී න කර්තව්‍යා නහි ශූන්‍යා වසුන්ධරා.

79 යස්‍ය, යමක්හුගේ; හෘදයෙ, ලෙහිද: කපොලයොඃච, දෙකපොලයෙහිද; රොමාණි, ලොම්හු, නසන්ති, නැත්තාහුනම්; තෙන එබඳු දුර්ජනයාහා; මෛත්‍රී, මෛත්‍රීය; නකර්තව්‍යා, නොකටයුත්තීය; වසුන්ධරා, පෘථිවිතලය; නහිශූන්‍යා, සිස්නොවන්නීය නවත් මෛත්‍රී කරන්නට සත්ත්වයෝ ඇත්තාහුයි.

80 අග්නිං ප්‍රදීපං කාෂ්ඨඤ්ච රුධිරං මලිනාම්බරම්
මිත්‍රසජ්ජන බන්ධූනාම් අන්තරෙණ න සංහරෙත්.

80 අග්නිම්, ගිනිද; ප්‍රදීපම්, පහන්ද; කාෂ්ඨඤ්ච, දරද; රුධිරම්, ලෙහෙද; මලිනාම්බරම්, කිලුටුපිළිද යන මෙතෙක්දෙය; මිත්‍රසජ්ජන බන්ධූනාම්, යහලුවෝය සත්පුරුෂයෝය නෑයෝය යනමොවුන්ගේ; අන්තරෙණ, මැදින්; නසංහරෙත්, ගෙණ නොයන්නේයි.

81 අනිදීක්ෂො මහාමූර්ඛඃ මධ්‍යමස්තු විචක්ෂණඃ
වාසුදෙවං පුරස්කෘත්‍ය සර්වේව මානකාශශධාඃ

81 අනිදීක්ෂඃ, ඉතාළස්නැනැත්තේ; මහාමූර්ඛඃ, මහාමූර්ඛනම් වන්නේය; මධ්‍යමස්තු, මධ්‍යමතැනැත්තේ වනාහි; විචක්ෂණඃ, නුවණ නැති වන්නේයි; වාසුදෙවං පුරස්කෘත්‍ය, විෂ්ණු ප්‍රධානකොට ඇති සර්වේ මනකාඃ, සියළු අඟුටු මිනිස්සු; ශශධාඃ, සොරුයි.

82. ආයුෂ්මාන් ප්‍රාඞ්මුඛඃ ඛාදන් ධවාන් දක්ෂිණාමුඛඃ
පශ්චිමෙන යශස්විස්‍යාන්නාව ඛාදෙදුදඞ්මුඛඃ.

82 ප්‍රාඞ්මුඛඃ, නැගෙණහිරට මුහුණලාහිඳ; ඛාදන්, බත්කන්නේ වනාහි; ආයුෂ්මාන්, ආයු බොහොවන්නේයි; දක්ෂිණාමුඛඃ, දකුණුදිගට මුහුණලා හිඳ බත්කන්නේවීනම්; ධනවාන්, වස්තු ඇතිවන්නේයි; පශ්චිමෙන, බස්නාහිරට මුහුණලාහිඳ; බත්කන්නේවීනම්; යශස්විස්‍යාත්, යසපිරිවර සැප ඇති වන්නේයි; උදඞ්මුඛඃ, උතුරුදිගට මුහුනලාහිඳ; නවඛාදෙත්, නොකන්නේයි.

83 කර්ම්මාපරාධාත් සත්වානාං විනාශෙ සමුපස්ථිතෙ
අනයො නයරූපෙණ බුද්ධිමාක්‍රම්‍යය තිෂ්ඨති.

83 සත්වානාම්, සත්වයන්ගේ, කර්ම්මපරාධාත්, ක්‍රියා වැරදීමෙන්; විනාශෙසමුපස්ථිතෙ, විනාසය එළඹ සිටිකල්හි; අනයඃ, නොකටයුත්ත; නයරූපෙණ, කටයුතු සැටියෙන්; බුද්ධිමාක්‍රම්‍යා නුවන මැඩගෙණ; තිෂ්ඨති, සිටීනේයි.

84 විවද්භිරභිසම්බන්ධා ද්‍යර්ථං වහතිභාරති
පාෂාණෙපි මණිස්පර්ශාජ්ජායතෙ භූෂණාර්හතාම්.

84 භාරති, සරස්වතීතොම; විවද්භිරභිසම්බන්ධාත්, පණ්ඩිතයන් හා එක්වීම හෙතුකොටගෙණ; අර්ථංවහති, අර්ථය උසුලයි (හෙවත් සරස්වතීතොම ශබ්දාර්ථය දෙන්නීය); පාෂාණෙපි, පහණද; මණිස්පර්ශාත්, මාණික්‍යයන් හා ස්පර්ශය හෙතුකොටගෙණ; භූෂණාර්හතාම් ජායතෙ, ආභරණයට සුදුසුවන්නේයි.

85 කොහිනාම මනුෂ්‍යෙෂු ජානන්නපි විචක්ෂණඃ
හරිණී පදමාත්‍රෙණ චර්ම්මණා න චලිකෘතඃ.

85 හරිණීපද මාත්‍රෙණ, හරිණීයගේ පදමාත්‍රවූ; චර්ම්මණා, සමින්; මනුෂ්‍යෙෂු, මනුෂ්‍යයන් කෙරෙහි; ජානන්නපි, දන්නාවූද; කොහි නාම, කවරනම්; විචක්ෂණඃ, නුවනැත්තෙක්; නචලිකෘතඃ, නොසෙල්වෙනලද්දේද චචලවන්නේමැයි.

86 ත්වයා තෘණානි භොජ්‍යානි වරං හරිණකානනෙ,
න ජාතුභින්නාමය්‍යාදෛඃ පුරුෂෛස් සහ සංගමඃ.

86 හරිණකානනෙ, මෘගයන් ඇති වෙනෙහි; ත්වයා, තාවිසින්; තෘණානි, තෘණයෝ; භොජ්‍යානි; අනුභවකටයුත්තාහුය; වරම්, ඒ උතුම; ජාතු, කිසිකලෙකත්; භින්නාමය්‍යාදෛඃ, ආචාරබිඳපීම් ඇති; පුරුෂෛඃ සහ, පුරුෂයන් හා; සංගමඃ, එක්ව විසීම; න, උතුම්නො වන්නේමැයි.

87 මහානප්‍යල්පතාං යාති නිර්ගුණෙ ගුණවානපි
ආධාරාදෙය සම්බන්ධාද් ගජේන්ද්‍රඉව දර්පණෙ.

87 නිර්ගුණෙ, ගුණනැත්තන් කෙරෙහි (හෙවත් ගුණනැත්තන් හා එක්වූකල) ගුණවානපි, ගුණඇත්තාවූ; මහානපි, මහත්වූත් සාවතෙම; අල්පතාං යාති, සුලුබවටයේ; කුමක්මෙන්දයත්–ආධාරාධෙය සම්බන්ධාද්, ආධාරාධෙය දෙදෙනාගේ සම්බන්ධයෙන්; දර්පණෙ කැඩපතෙහි පෙණෙන; ගජේන්ද්‍රඉව, හස්තිරාජයාමෙනි.

88 මහත්ස්වපි ස්වදුඃඛෙෂු න්‍යස්තධෛර්‍ය්‍යාඃ කෘපාත්මනඃ
මන්දෑවප්‍යන්‍යදුඃඛෙතු කම්ප්‍යන්තෙ යත්තදද්භුතම්.

88 කෘපාත්මනඃ, කරුණාඇති මහොත්තමයෝ; මහත් ස්වපි, මහත්වූද; ස්වදුඃඛෙෂු, තමන්ගේ දුකෙහි; න්‍යස්තධෛර්‍ය්‍යාඃ, හරණලද ධෛර්‍ය්‍යඇත්තාහුවෙති; මෘදුෂුඅපි, මදවූද; අන්‍යදුඃඛෙතු, අනුන්ගේ දුකෙහි; කම්ප්‍යන්තෙ, කම්පාවෙති යන; යත්, යමෙක් ඇද්ද; තත්, එය; අද්භුතම්, ආශ්චර්‍ය්‍යයි.

89 සතාං ස්වල්ප මපිද්‍රව්‍යං කූපෙ ජල මිවාශ්‍රයෙත්
ප්‍රභූතමප්‍ය සාධූනාං ද්‍රව්‍යං ජලමිවාර්ණවෙ.

89 සතාම්, සත්පුරුෂයන්ගේ; ද්‍රව්‍යම්, වස්තුව; ස්වල්පමපි, ස්වල්පවූයේද; කූපෙජලමිවාශ්‍රයෙත්, ලිඳදියමෙන් ඇසුරුකරන්නේය; අසාධූනාම්, අසත්පුරුෂයන්ගේ; ද්‍රව්‍යම් වස්තුව; ප්‍රභූතම්පි, හෝවූයේද; අර්ණවෙජලම්ව, සමුද්‍රජලයමෙනි..

90 නොදයාය විනාශාය බහුනායකතාධ්‍රැවම්
නො නම්ෂ්‍යන්ති විනශ්‍යන්ති පද්මාන්‍යකේස්තු සප්තභිඃ

90 බහුනායකතා, බොහෝදෙනෙකුගේ නායකබව; ධ්‍රැවම්, අන්‍යාර්ථයෙන්; නොදයාය, වැඩට නොවන්නේය; විනාශාය, විනාශය පිණිස වන්නේය; ඒ එසේමැයි; අකේස්තුසප්තභිඃ, සත්හිරකින් වනාහී; පද්මානි පද්මයෝ; නොනම්ෂ්‍යන්ති, ප්‍රබොධ නොවෙති; විනශ්‍යන්ති, විනාශවෙති.

91 උත්සාහො රිපුවත්මිත්‍ර මාලස්‍යං මිත්‍රවද්‍රිපුඃ
උත්සාහො මෘතවච්ඡූත් ප්‍රමාදෙ මෘතවද්විෂම්.

91උත්සාහඃ, උත්සාහයතෙම; රිපුවත්, සතුරෙකු බඳුවූ; මිත්‍රම්; යහලුවෙක; ආලස්‍යම් මිත්‍රවද්‍රිපුඃ, අලසබව මිත්‍රයෙකු බඳුවූ සතුරෙක; (පුනරපි කිංභූතඃ, නැවතකෙසේද) උත්සාහඃ අමෘතවත් විද්‍යාත්, උත්සාහය අමෘවක් මෙන් දන්නේය; ප්‍රමාදඃ, ප්‍රමාදය, අමෘතවත්, අමාවක් බඳුවූ;විෂම්; විෂයකි.

92 වරං තස්කර සම්බන්ධඃ සාධුභිස් සහ සඞ්ගමාත්
,තස්කරෙහි හරන්ත්‍යර්ථං සාධුස්තු හෘදයං හරෙත්.

92 සාධුභිඃ සහ, සත්පුරුෂයන්හා; සඞ්ගමාත්, එක්විමට වඩා;තස්කර සම්බන්ධඃ,සොරුන්හා එක්විම; වරම්, උතුම, හි, ඒ එසේමැයි;තස්කරඃ, සොරතෙමේ; අර්ථම්, වස්තුව; හරති, පැහැරගෙණයේ; සාධුස්තු, සත්පුරුෂතෙම වනාහී; හෘදයංහරෙත්, හෘදය ගෙණයන්නේයි.

93 බාල ස්ත්‍රී මක්ෂිකාතුණ්ඩං සාෂිණම කමණ්ඩලම්
ස්‍රොතොග්‍ර ඵල තාම්බූලං නොච්ඡිෂ්ට මුපජායතෙ.

93 බාල, බාලයෝය; සත්‍රි, සත්‍රිහුය; මක්ෂිකාතුඩම්; මැස්සෝය, යන මොවුන්ගේ තුඩද; සෘෂීණාඑකමණ්ඩලම්, සෘෂීන්ගේ කමණ්ඩලාවද; ස්‍රොතොංම්බු ගඟාදියද; ඵලං සැමඵලද; තාම්බුලම්, බුලත්ද යන මේ; උච්ඡිෂ්ටං; ඉඳුල්; න උපජායතෙ, නොවන්නේයි.

94 රාජාභිෂෙක ශත්‍රුසෙන කන්‍යාදානෙ ධනාජ්ජනෙ
විද්‍යාග්‍රහණ රොගෙෂු කාලක්‍ෂෙපං න කාරයෙත්.

94 රාජාභිෂෙකෙ, රජුන්ගේ ඔටුනුපැලඳීමෙහිද; සත්‍රුසෙන සතුරන්නැසීමෙහිද; කන්‍යාදානෙ, කන්‍යාසතීන් දීමෙහිද; ධනාජ්ජනෙ, වස්තුරැස්කිරීමෙහිද; විද්‍යාග්‍රහණ රොගෙෂු, ශාස්ත්‍රඉගැන්මය රොගපරිහාරය යන මෙහිද; කාලක්‍ෂෙපං න කාරයෙත්, කල්නොයවන්නේයි.

95 පක්‍ෂීණාංබල මාකාශං මත්‍ස්‍යනා මුදකං බලම්
දුර්බලස්‍ය බලෝ රාජා බාලස්‍ය රොදනං බලම්

95පක්‍ෂිනාම් පක්‍ෂීන්ට, බලම්, බලයනම්, ආකාශම්, අහසයම; මත්‍ස්‍යනාම් මසුන්ට උදකම් ජලයබලම් බලය දුර්බලස්‍යදුප්පතුන්ට රාජා රජතෙම බලඃ බලය බාලස්‍ය බාලයාට රොදනං හැඬීමබලම් බලයි.

96 උත්පලස්‍ය ර්වින්දස්‍ය මත්‍ස්‍යස්‍ය කුමුදස්‍යච
එකයෝනිප්‍රසුතානාං තෙෂාං ගන්ධඃ පෘථක් පෘථක්

96 උත්පලස්‍ය, උත්පලයාගේද; අරවින්දස්‍ය, පද්මයාගේද මත්‍ස්‍යස්‍ය, මත්ස්‍යයාගේද; කුමුදස්‍යච, කුමුදයාගේද; එකයෝනිප්‍රසුතානාං, එකජලයෙහි උපන්නාවූ; තෙෂාම්, ඔවුන්ගේ; ගන්ධාඃ ගන්ධයෝ; පෘථක්පෘථක්, වෙන වෙනමැයි.

97 මහතාමාශ්‍රයම් ප්‍රප්‍ය ලඝීෂෝප්‍යභිවර්ධතෙ
නෙරුපර්වතමාශ්‍රිත්‍ය සෞවර්ණ්ණඉව පක්‍ෂිණාම්.

97 මහතාමාශ්‍රයම්ප්‍රාප්‍ය, මහතුන්ගේ ආශ්‍රයට පැමිණ! ලඝීෂෝපි; අතිශයින් ලඝුවූයේද; අභිවර්ධතෙ, මහත්වූ අභිවෘද්ධිට පැමිණෙයි; කුමක්මෙන්දයත්—නෙරුපර්වත මාශ්‍රිත්‍ය, (රන්වන්) නේරුනම් පර්වතයඇසුරුකොට; සෞවර්ණ්ණඉව පක්‍ෂිණාම්, පක්‍ෂීන්ගේ සුවර්ණ වර්ණයමෙනි.

98 අනභ්‍යාසෙ විෂං ශාස්ත්‍ර මජීර්ණ්ණ භෝජනං විෂම්
දරිද්‍රස්‍ය විෂම් ගොෂ්ඨී * වෘද්ධස්‍ය තරුණී විෂම්.

98අනභ්‍යාසෙ, අභ්‍යාස නොකළකල්හි; ශාස්ත්‍රම්, ශාස්ත්‍රය; විෂම් විෂය; අජීර්ණ්ණ, කෑ ආහාර නොදිරුකල්හි; භොජනම් නැවත කෑම, විෂම්, විෂය; දරිද්‍රස්‍ය, දිළින්දාහට; ගොෂ්ඨි, සභාව; විෂම්, විෂය; වෘද්ධස්‍ය, වෘද්ධයාහට; තරුණී, ළඳුරිතොම; විෂං, විෂනම් වන්නේයි.

99 මරණාන්තාපරං දුඃඛ මුක්තමසතීති පණ්ඩිතෛඃ
තුනම් පරගෘහවාරෙ නව ක්‍ෂණමුපස්ථිතාත්

---

* විෂං සභා දරිද්‍රස්‍ය, හිතෝපදේශ.

99 මරණාත්, මරණයටවඩා; අපරදුඃඛං, අනික්දුකෙක්; න අසනි ති, නොමඇත්තේයයි; පණ්ඩිතෛඃ, පණ්ඩිතයන් විසින්; උක්තම් කියනලදී, නූනම්, ඒකාන්තයෙන්; පරගෘහවාරෙ, අනුන්ගේගෙ රකඩ; ක්ෂණමුපසපීතාත්, මදඇසිල්ලකුදු, එලඹසිටීමටවඩා අනික් දූකෙක්, නව නැතැයි දන්නාලදී.

100 සවභාවෝ යාදෘශො යස්‍ය න ජහාති කද චන,
අඟාරශ්ශතධෞතොපි මලිනත්‍වං න මුඤ්චති

100 යස්‍ය, යමක්හුගේ; යාදෘශඃ, යම්බඳුවූ; ස්වභාවඃ ස්වභාවයෙක්වේද ඒ; කදාචනං, කිසිකලෙකත්; නජහාති, නොහරින්නේය. කුමක්මෙන්දයත්—අඟාරඃ අඟුර; ශතධෞතඃඅපි, සියක්වර සේදූයේනමුදු; මලිනත්‍වං, කිලුටුභාවය; නමුඤ්චති, නොහරින්නේයඑමෙනි

101 ශතෙෂු ජායතෙ ශූරඃ සහශ්‍රෙෂුච පණ්ඩිතඃ
වක්තා ශතසහශ්‍රෙෂු දාතා ජගති දුර්ලභඃ

101 ශතෙෂු, සියගනන්, ජනයා කෙරෙහි; ශූරඃ, ශෞර්‍ය්‍යයවීයයී ඇතිඑකෙක්; ජායතෙ, උපදී; සහශ්‍රෙෂුච දහස්ගණන් ජනයා කෙරෙන්; පණ්ඩිතඃ එකෙක් පණ්ඩිතවෙයි; ශතසහශ්‍රෙෂු, ලක්ෂගණන් ජනයාකෙරෙහි, වක්තා, එකෙක් කීමෙහි බිනීමෙහි දක්ෂවේ; දාතා තෘගිඑකෙක්; ජගති ලෝකයෙහි; දුර්ලභඃ, දුර්ලභවෙයි හෙවත්නොලැබෙයි

නිමි

---

වන්දෙ, මුනීන්ද්‍රං විධ්වස්ත මොහධ්වාන්තං විකල්මෂම්
සච්චිතෙවාරවින්දං යෝ මනමනඃ සම්ප්‍රබොධතෙ.

# හිතොපදෙශය

1 සිද්ධිඃ සාධ්‍ය සතාමස්තු ප්‍රසාදාන්තස්‍ය ධූජ්ජටෙඃ
ජාහනවීඵෙන ලෙඛෙව යන්මූර්ධනි ශශිනඃකලා.

1 යමෙකුගේ ඉසෙහි සඳකලාව ගඟානම්ගඟ පෙනරොදක්සේ (බබලාද)ඒ ඊශ්වරයාගේ පැහැදීම් නිමිත්තෙන් පණ්ඩිතයන් විසින් සිදුකටයුත්තෙහි සිද්ධියවේවා.

2 ශ්‍රුතොහිතොපදෙශොයං පාටවං සංස්කෘතොක්තිෂු
වාචාං සර්‍ව්‍යත්‍රං වෛචිත්‍ර්‍යං නීතිවිද්‍යාං දතිච.

2 අසනලද මෙහිතෝපදේශයතෙමේ සංස්කෘත වචනයන්හි පටුබවද හැමතැන්හි වචනයන්ගේ විසිතුරුබවද නීතිශාස්ත්‍රයදදේ

3 අජරාමරවත් ප්‍රාඥෙ විද්‍යාමර්ථංචවින්තයෙත්
ගෘහිත ඉව කෙශෙෂු මෘත්‍යුනාධර්මමාචරෙත්.

3 නුවනැත්තේ ජරාමරණ නැතිසේ ශාස්ත්‍රයද වස්තුවද සිතන්නේය, මරහුවිසින් හිසකෙසින් ගන්නාලද්දෙක්සේ සුචරිත ක්‍රියායෙහි[ න් ]හැසිරෙන්නේයි.

4 සර්වද්‍රව්‍යෙෂු විද්‍යෛව ද්‍රව්‍යමාහුරනුත්තමම්
අහාර්‍ය්‍යත්වාදනර්ඝ්‍යත්වා දක්‍ෂයත්වාච්ච සර්වදා.

4 පැහැරගතනොහෙන හෙයින්ද අගයකොටලිය නොහෙන හෙයින්ද හැමකල්හි ක්‍ෂයනොවනහෙයින්ද සියලු වස්තූන් අතරෙන් ශාස්ත්‍රයම ඉතාඋතුම්වූ වස්තුවෙකැයි කියත්.

5 සඞ්ගමයති විද්‍යෛව නීචගාපි නරං සරිත්
සමුද්‍රමිව දුර්ධර්ෂං නෘපං භාග්‍යමතඃ පරම්.

5 පහතයන්නාවූද ගඟමුහුද සමග මෙන් ශාස්ත්‍රයම මනුෂ්‍යයා ලංවිය නොහෙන රජුහා සමගිකෙරෙයි ඉන්පසු උතුම්වූ ඉසුරුහා (සමගිකෙරෙ).

6 විද්‍යාදදාති විනයං විනයාද්‍යාති පාත්‍රතාම්
පාත්‍රත්වාද්ධනමාප්නොති ධනාද්ධර්මං තතඃ සුඛම්

6 ශාස්ත්‍රය හික්මීම දෙයි හික්මීමෙන් සුදුසුබවට හෝ (ගරුකට යුතුබවට) පැමිනෙයි සුදුසු බැවින් ධනයට පැමිණෙයි ධනයෙන් පුණ්‍යයටද එයින් සැපයටද (පැමිනේ.)

7 විද්‍යා ශාස්ත්‍රඤ්ච ශාස්ත්‍රඤ්ච ද්වෙ විද්‍යෙ ප්‍රතිපත්තයෙ
ආද්‍යා හාස්‍යාය වෘද්ධත්වෙ ද්විතීයාද්‍රියතෙ සදා

7 විද්‍යාතොම ආයුධය අනුශාසනාවයි කියා පිළිපැදීම පිණිස ශාස්ත්‍ර දෙකෙක් වෙත් මහළු බැව්හිදී ප්‍රථම විද්‍යාතොම සිනා පිණිස වේ දෙවෙනි විද්‍යාව වනාහී හැමකල්හී ආදරකරණුලැබේ.

8 යන්නවෙ භාජනෙ ලග්නඃ සංස්කාරො නාන්‍යථාභවෙත්
කථාච්ඡලෙන බාලානාං නීතිස්තදිහ කථ්‍යතෙ

8 යම්හෙයකින් අළුත්බඳනක ලැගුණු (හෙවත් එබ්බු) සකස් කිරීම හෝ මාලාදිකර්මය අන්පරිද්දකින් නොවේද එහෙයින් බාල යන් පිණිස කථාව්‍යාජයෙන් මෙහි නීතිය කියනුලැබේ.

9 මිත්‍රලාභඃ සුහෘද්භෙදො විග්‍රහඃ සන්ධිරෙවච,
පඤ්චතන්ත්‍රාත් තථාන්‍යස්මද් ග්‍රන්ථාදාකෘෂ්‍ය ලිඛ්‍යතෙ.

9 මිත්‍රලාභය මිත්‍රභෙදය යුද්ධය සමගිබවය යන මේ පඤ්චතන්ත්‍ර නම් පොතින්ද එසේම අනික් ශාස්ත්‍රයෙන්ද ආකර්ෂනයකොට හෙවත් ඇදලියනු ලැබේ.

10 අස්ති භාගීරථීතීරෙ පාටලිපුත්‍රනාමධෙයං නගරං
තත්‍ර සර්වස්වාමිගුණොපෙතඃ සුදර්ශනොනාම නරපතිරාසීත්
සභූපතිරෙකදා කෙනාපි පඨ්‍යමානං ශ්ලොකද්වයං ශුශ්‍රාව.

10 ගංගානම් ගංතෙර පාටලිපුත්‍රනම් නුවරෙක් අත්තේය. එහි සියලු රාජගුනයෙන් යුක්තවූ සුදර්ශනම් රජෙක්විය ඒ රජතෙම එක්කලෙක කිසිවෙකු විසින් කියනු ලබන ශ්ලොක දෙකක් ඇසුයේලු.

**එනම්**–11 අනෙකසංශයොච්ඡෙදි පරොක්ෂාර්ථස්‍යදර්ශකම්.
සර්වස්‍ය ලොචනං ශාස්ත්‍රං යස්‍යනාස්ත්‍යන්ධඑව සඃ

11 නොයෙක් සැකසිඳින සුළුවූ නොහමුඅර්ථයෙන් දක්මට හේතුවූ සියල්ලට ඇසක්වැනිවූ ශාස්ත්‍රය යමෙකුට නැද්ද හේතෙම අන්ධමැයි

12 යෞවනං ධනසම්පත්තිඃ ප්‍රභුත්වමවිවෙකිතා
එකෛක මප්‍ය නර්ථාය කිමු යත්‍ර චතුෂ්ටයං

12 තරුණබවයවස්තුසම්පත ප්‍රධානබවයඅපරීක්ෂාකාරිබවය සන මෙයින් එකක් එකකුදු අවැඩටකාරණය යම්තැනක සතරම වීනම් කියනුකිම

13 ඉත්‍යාකර්ණ්‍යාත්මනඃ පුත්‍රාණමධීගත ශාස්ත්‍රාණාං
නිත්‍යමුන්මාර්ගගාමිනාං ශාස්ත්‍රානනුෂ්ඨා
නෙනොද්විග්නමනා සරාජා චින්තයාමාස

13 මෙසේ අසා ශාස්ත්‍ර අවබෝධ නොකළ නිතර නොමගයනසුලු තමාපුතුන්ගේ ශාස්ත්‍රය අනුව නොයාමෙන් කලකිරුණු සිත්ඇති ඒරජතෙම සිතුයේලු

14 කොර්ථඃ පුත්‍රෙණ ජාතෙන යො න විද්වාන්න ධාර්මිකඃ
කාණෙන චක්ෂුෂා කිංවා චක්ෂුඃ පීඩෛව කෙවලම් ;।

14 යමෙක් අපණ්ඩිතද දැහැමින් නොහැසිරේද උපන්නාවූ එවැනි පුතුගෙන් කවර වැඩෙක්ද කණවූ ඇසින්හෝ කවර වැඩෙක්ද හුදක් ඇස්පෙලීමක් මැයි

15 අජාතමෘත මූර්ඛාණාං වරමාද්‍යෞ න චාන්තිමඃ
සකෘද් දුඃඛකරාවාද්‍යා වන්තිමස්තු පදෙ පදෙ,

15 නූපන් මළ මෝඩ (පුතුන්) තුන්දෙනාගෙන් ආදි දෙන්නා උතුම් අන්තිම (මෝඩ) යා උතුම් නොවෙයි පළමු දෙන්නා එකවරක් දුක්කෙරෙත් අන්තිමයා වනාහි පියෙහි පියෙහි (දුක්කෙරෙ)

16 ස ජාතො යෙන ජාතෙන යාති වංශඃ සමුන්නතිම්
පරිවර්තිනි සංසාරෙ මෘතඃ කො වා න ජායතෙ

16 උපන්යමෙක් කරණකොටගෙණ කුලය උසස්බවටයේද හේතෙම උපන්නේවෙයි (එසේ නොවීනම්) පෙරලෙන සුලුවූ සසර මලාවූ කවරෙක් නූපදීද.

17 ගුණිගණ ගණනාරම්භෙ න පතති කඨිනී සසම්භ්‍රමාද්‍යස්‍ය
තෙනාම්බා යදි සුතිනී වද බන්ධ්‍යා කීදෘශී භවති.

17 ගුණඇත්තවුන් සමූහය ගණනට පටන් ගැන්මෙහිදි යමෙකුගේ තෙල්ල ලීලාසහිතව නොවැටෙන්නීද ඔහු කරණකොටගෙණ මවුතෙම ඉදින් දරුවන් ඇත්තී නමුත් පිනැත්තිය කෙබඳු වද එකක්දැයි කීය·

18 දානෙ තපසි ශෞර්යෙ ච යස්‍ය න ප්‍රථිතං යශඃ
විද්‍යායාමර්ථලාභෙ ච මාතුරුච්චාර එවසඃ

18 දානයෙහිද තපස්හිද සුරබැව්හිද ශාස්ත්‍රයෙහිද වස්තුලාභයෙහිද යමෙකුගේ යසස නොපතළේනම් හේතෙම මවගේ මලපිඩෙක් මැයි.

19 වරමෙකො ගුණී පුත්‍රො නච මූර්ඛ ශතෛරපි
එකශ්චන්ද්‍රස්තමො හන්ති නච තාරාගණෛරපි.

19 ගුණඇත්තාවූ එක්පුතෙක් උතුම් මෝඩපුතුන් සියගණනිනුත් උතුම් නොවෙයි එක්සඳෙක් අඳුර නසයි තරුරැස් ගණනිනුත් ඒ නොවෙයි

20 පුණ්‍යතීර්ථෙ කෘතං යෙන තපඃ ක්වාපි සුදුෂ්කරම්
තස්‍ය පුත්‍රො භවේද්වශ්‍යඃ සමෘද්ධො ධාර්මිකඃ සුධීඃ,

20 යමෙකු විසින් කිසි පින්තොටෙක ඉතාදුෂ්කරවූ තපසක් කරණලදද ඔහුගේ පුත්‍රතෙම වසඟකටහැකිවූ මොනවට වැඩුනු දැහැමින් හැසිරෙණ මනා නුවනැත්තෙක් වෙයි.

21 අර්ථාගමො නිත්‍ය මරොගිතාච ප්‍රියාච භාර්‍ය්‍යා ප්‍රියවාදිනීච
වශ්‍යශ්චපුත්‍රොර්ථකරීච විද්‍යා ෂඩ්ජීවලොකස්‍යසුඛානිරාජන්

21 දෙවයෙනි වස්තුරැස්වීමය නිති නිරොගිබවය ප්‍රිය අඹුවය නමිහිරි වචනය වසඟකළහැකි පුත්‍රය වැඩකරු ශාස්ත්‍රය යන සදෙන සත්වලෝකය හට සුවයෝයි (හෙවත් සුවඵලවත්.)

22 කොධනෙන බහුභිඃ පුත්‍රෛඃකුශලා පූරණාධකෛඃ
වරමෙකඃ කුලාලම්බි යත්‍රවිශ්‍රෑයතෙ පිතා·

22 කොටුවපුරවන කුරුනිවැනි බොහෝ පුතුන් කරණකොට ගෙණ කවරෙක් වාසනාවන්තද පියතෙම යමෙක් කරණකොට ගෙණ ප්‍රසිඬවනුලැබේද කුලය එල්වන සුලුවූ (එවැනි) එකෙක්ම උතුම්.

23 ඍණකර්තා පිතා ශත්‍රුෑර්මාතා ච ව්‍යභිචාරිණී
භාර්‍ය්‍යා රූපවති ශත්‍රුඃ පුත්‍රඃ ශත්‍රුර පණ්ඩිතඃ

23 නයකරණ පියතෙම සතුරුය පතිවෘත්තනුවූ මවුනොමෝද සැතිරිය රූවත් අඹුනොමෝන් සැතිරිය පණ්ඩිතනුවූ පුත්‍රතෙමේත් සතුරුය.

24 අනභ්‍යාසෙ විෂං විද්‍යා අජීර්ණෙ භොජනං විෂම්
විෂං සභා දරිද්‍රස්‍ය වෘද්ධස්‍ය තරුණී විෂම්.

24 පුරුදුනොකල කල්හි විද්‍යාතොම විෂය කෑ ආහාර නොදිරුකලී නැවත අනුභවකිරීම විෂය දිළින්දාහට සභාතෙම විෂය මහල්ලාහට තරුණිය විෂයි.

25 යස්‍ය තස්‍ය ප්‍රසූතොපි ගුණවාන් පූජ්‍යතෙ නරඃ
ධනුර්වංශ විශුද්ධොපි නිර්ගුණඃ කිං කරිෂ්‍යතෙ

25 යම් කාවිසින් උපදවනලදුවත් ගුණවත් සත්වතෙමලෝවැස්සා විසින් පුදනුලැබේ. යෂ්ටිය සුඬලවත් දුන්නතෙමේ දුනුදිය නැත්තේ කුමක්කරන්නේද.

26 හා හා පුත්‍රක නාධීත සුගතෛතාසු රාත්‍රිෂු
තෙන ත්වං විදුෂාං මධ්‍යෙ පඞ්කෙ ගෞරිව සීදසි

26 මොනවට පසුවුන කඹුරුවන්මේ රෑදවස්වලනොහදාරණ ලද පුත්‍රය නො ඒහෙතුවින් පණ්ඩිතයන් මැද මඩෙහි ගවයෙකුසේ ගැලෙහිය බෙදයකි

27 තත්කථමිදානිමෙතෙ මම පුත්‍රා ගුණවන්තඃ ක්‍රියන්තාම්.

27 ඒහෙයින් මේ මාගේ දරුවෝ දූන් කෙසේ ගුණවත්කරණු ලබද්දෝ

28 ආහාර නිද්‍රා භය මෛථුනඤ්ච
සාමාන්‍යමෙතත් පශුභිර් නරාණාම්
ධර්මොහි තෙෂාමධිකො විශෙෂො
ධර්මෙණ හිනාඃ පශුභිස්සමානාඃ.

28 ගොදුරුය නිදිය බියය මෙවුන්දමය යන මෙය මිනිසුන්ගේ [උවත්] තිරිසනුන් හා සම්බන්ධවේය ඔවුන්ගේ වනාහී වැඩිවිශෙෂ නම් යහපත් ක්‍රියාය දහමින් හීනවූවෝ සිව්පාවුන්හා සමයෝයි.

29 ධර්මාර්ථකාම මොක්ෂාණං යස්‍යෛකොපි නවිද්‍යතෙ
අජාගල ස්තනස්‍යෙව තස්‍ය ජන්ම නිරර්ථකම්.

29 යමෙකුට කුසල ක්‍රියාය ධනය කාමසැපය නිවන යන චතුර්වර්ගසම්පපත්තියෙන් එකකුත් නැත්තේද එළියකගේ ගෙලෙහි තනයක්සේ ඔහුගේ උත්පත්තියනිස්ඵලයි.

30 ආයුඃ කර්මච විත්තඤ්ච විද්‍යා නිධන මෙවච
පඤ්චෛතාන්‍යපි සෘජ්‍යන්තෙ ගර්භස්ථස්‍යෛව දෙහිනඃ

30 ආයුසය ක්‍රියාය ධනය ශාස්ත්‍රය මරණය යනමේ පසම ගැබෙහි සිටි සත්වයා පිළිබඳවම (හෙවත් සත්වයාගැබ හිඳිද්දීම) මවනු ලබත්.

31 අවශ්‍යභාවිනො භාවා භවන්ති මහතාමපි
නග්නත්වං නීලකණ්ඨස්‍ය, මහාහිශයනං හරෙඃ

31 වනසුලුවූ භාවයෝ මහතුන්ටත් ඒකාන්තයෙන් වෙත්මැයි (ඒ මෙසේයි) ඊශ්වරයාගේ නිර්වස්ත්‍රබවද විෂ්ණුහුගේ මහානාග සයනයද (යනුදෘෂ්ටාන්තයි)

32 යදභාවි න තද්භාවි, භාවිචෙන්න තදන්‍යථා
ඉති චින්තාවිෂඝ්නොයං, මගදඃ කිංන පීයතෙ

32 යමෙක් නොවනසුලුද ඒ නොවනසුලුමය ඉදින් වනසුලුනම් ඒ අන්පරිද්දෙකින් නොවෙයි මෙසේවූ සිතිවිලි විෂනසන මේ බෙහෙත කුමකැයි නොබොනුලැබේ.

33 එතත් කාර්‍යාක්ෂමාණං කෙෂාඤ්චිදලසස්‍ය නිබන්ධනං වචනං
33 මෙයකටයුත්තහි අදක්ෂකිසිවෙකුගේ මැලිබවටකරණවූබසෙකි

34 නදෛවමපි සඤ්චින්ත්‍ය, ත්‍යජෙදුද්‍යොගමාත්මනඃ
අනුද්‍යොගෙන තෛලානි තිලෙභ්‍යො නාප්තුමර්හති.


34 භාග්‍යයසිතාත් තමාගේ උත්සාහය නොහරණේය කවරහෙයින්ද යත් නිරුත්සාහයෙන් තලින්තෙල් ලබන්ට නුසුදුස්සේය.

35 උද්‍යොගිනං පුරුෂ සිංහමුපෛති ලක්ෂ්මී
දෛවෙන දෙයමිති කාපුරුෂා වදන්ති
දෛවං නිහත්‍ය කුරු පෞරුෂ මාත්මශක්ත්‍යා
යත්නෙ කෘතෙ යදි නසිද්ධ්‍යති කොත්‍ර දොෂඃ

35 ශ්‍රීදේවතාතොම උත්සාහවත්වූ පුරුෂොත්තමයා කරා එළඹේ භාග්‍යය විසින් දියයුතුයයි කුත්සිතයෝ කියත් දෛවය පැහැර තමාගේ වියර්යෙන් පුරුෂකෘත්‍යය කරව--යත්නකළකල ඉදින් නොසෑදේනම් මෙහි කවර වරදද.

නිමි.

# සබ්බ දානං ධම්ම දානං ජීනාති



නිබ්බාන පච්චයෝ හෝතු